**රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව**

**2026 පෙබරවාරි 12 දින මහා සභා රැස්වීමේ වාර්තාව**

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ 2026.02.12 දින පෙ.ව 10.00 ට පමණ රුවන්වැල්ල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පවත්වන්නට යෙදුනු ගරු මහා සභාවේ රැස්වීම් වාර්තාවයි.

1. ගරු සභාපති - ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා
2. ගරු උප සභාපති - ජේ.එම්.එච්. ජයවර්ධන මහතා
3. ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී - ආර්.ජ්. සෙනරත් බංඩාර රාජපක්ෂ මහතා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.එස්. මොහොමඩ් රසියා සකාෆ් මහතා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ආර්. සමන් ඉන්දික දයාරත්න මහතා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.කේ. කමල් දේශප්‍රිය මුණසිංහ මහතා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - යූ.ජී. සුදත් අනුර උඩුමල්වත්ත මහතා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී. නිමල් විජේසේකර මහතා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්. සුසන්ත ප්‍රියන්ජිත් මහතා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්. මහිලාල් සුමිත් කුමාර මහතා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඒ. මධුෂ සචිත් කුමාර මහතා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ජී.වී. රුචිනි ලක්ෂ්මී ප්‍රියදර්ශිනී මහත්මිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - වයි.ජී. සුදත් හේමන්ත මහතා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එම්.බී. ස්වර්ණතිලකා මහත්මිය
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.කේ. නීල් නෙල්ෂන් කඩදර මහතා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඒ. චූලංග අනුපිය අධිකාරී මහතා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.ඩබ්.ඒ. උපාලි සිරිවර්ධන මහතා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.පී. රත්නපාල පීරිස් මහතා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඩී.එම්. ශ්‍රී සාන්ති කුමාරි දිසානායක මෙනවිය
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී. ධම්මික සනත් රත්නසේකර මහතා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.සුමිත් රෝහාන් ප්‍රියදර්ශන මහතා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.ඩබ්.ඒ. සරත් සිරිවර්ධන මහතා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.ඒ. චන්ද්‍රානී හේමලතා මහත්මිය
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඩී. ප්‍රභාෂිනි රුක්ෂි මහත්මිය
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.එම්. ඉන්ද්‍රානි කුසුමලතා මහත්මිය
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එන්. අරුන ශාන්ත වීරසේකර මහතා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ ඉන්දික ජයලත් වේරගොඩ මහතා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ආර්.ඒ. චන්ද්‍ර පුෂ්ප කාන්ති මහත්මිය
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්. අමිත මහතා
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එම් . සිසිර කුමාර කස්තුරිසිංහ මහතා

**<u>නොපැමිණීම</u>**

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.පී. දිනිඳු සම්පත් කුලතුංග මහතා

02 . ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම් . සුසන්ත අජිත් කුමාර මහතා

**<u>ආගම සිහි කිරීම</u>**

පළමුව ආගම සිහි කිරීමෙන් පසුව ගරු මහා සභාවට පැමිණි සියළු දෙනා ගරු සභාපතිතුමා විසින් සාදරයෙන් පිළිගන්නා බව පවසමින් මහා සභාවේ කටයුතු ආරම්භ කරන ලදි.

**<u>ජාතික විරුවන් සිහි කිරීම</u>**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය විනාඩියක නිශ්ශබ්දතාවයක් ගත කරමින් ජාතික විරුවන් සිහි කරන ලදි.

**අ. පසුගිය රැස්වීමේ වාර්තාව සහා සම්මත කිරීම**

- 2026.01.08 දින ගරු මහා සභාවේ වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා වෙත එවා ඇති බවත්,එය කියවූවා සේ සලකා ඒ සම්බන්ධව යම් සංශෝධනයන් වේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුවත් කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී. රත්නපාල පීරිස් මහතා විසින් ,2026.01.08 දින ගරු මහ සභා වාර්තාවේ ,සංශෝධනය විය යුතු අවස්ථාවක් පෙන්වා දෙන ලදි.සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ,තමා විසින් සිදු කළ පැහැදිලි කිරීම් යටතේ වන,"ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස් පුෂ්පා වීරසේකර "ලෙස සටහන් විය යුතු බවත්, " විශ්‍රාම ජීවිතය සාර්ථක වේවා " ලෙස සටහන් විය යුතු බවත් දක්වන ලදි.
මෙම සංශෝධනය සහිතව 2026.01.08 දිනැති ගරු මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එන්. අරුන ශාන්ත වීරසේකර මහතා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ජී. සුදත් අනුර උඩුමල්වත්ත මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර, 2026.01.08 දින ගරු මහා සභාවේ වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**ආ. සභාපතිතුමාගේ නිවේදන වාරය**

1. දිට්වා සුළි කුණාටුවෙන් පසුව අපට රජය විසින් මිලියන 50 ක් වියදම් කිරීම සඳහා මුදල් ලබා දී ඇති බවත්,එයින් අප මිලියන 24 ක මුදලක් වියදම් කර ඇති බවත්,ඒ මුදල් ප්‍රතිපූර්ණය කිරීම සඳහා අවශ්‍ය මුදල් ලෙස ලැබී ඇති බවත්,අප ලබාගත් ආයතනවලට මුදල් දී කුලියට ගත් රථවාහන සඳහා වෙනත් උපකරණ හා ඒ සම්බන්ධයෙන් සියලු ගෙවීම් කටයුතු සිදු කර තිබෙව බව දන්වා සිටින ලදි.
2. ඉදල්පොල කසළ අංගනය අළුත්වැඩියා කටයුතු පසුගිය කාලයේ සිදු කළ බවත්, එහිදී ලක්ෂ 19 ක් වැනි මුදලක් යොදවා කාණු පද්ධතිය ,යකඩ වැට ,කැඩී තිබුණු ගේට්ටු යනාදිය සකස් කළ බවත්, එමෙන්ම පැත්තක කොන්ක්‍රීට් කිරීමක් කළ බවද රුපියල් මිලියන පහක් ලැබි ඇති බවත්,මළ අපද්‍රව්‍ය පිරිසිදු කිරීමේ ඒකකය වැඩිදියුණු කිරීම් සඳහා මිලියන පහක මුදල අනුමත වී ඇති බව දක්වන ලදි.
3. නාගරික සංවර්ධන අධිකාරිය අපට ආදාහනාගාරය සඳහා ඇස්තමේන්තු සකස් කරන ලෙස දන්වා ඇති බවත්,එනම් ආදාහනාගාරයේ රථගාල සකස් කිරීම සඳහා ඒ සඳහා මිලියන විස්සක් දක්වා මුදලක් දිස්ත්‍රික්කය සඳහාම ලබා දී ඇති බවත්, ඒයින් අපට පමණක් අනුමත වී ඇති බවත්,අපට එම කටයුතු කරගැනීමේ හැකියාව ඇති බවත් දක්වන ලදි.
4. ප්‍රාදේශීය සභාවේ ගොඩනැගිල්ලේ ඉහළම මහල සකස් කිරීම සඳහා සැලැස්ම අනුව ස්ලැබ් එක දැමීමට තිබුනද එය අප විසින් සාකච්ඡා කිරීමක් කළ අතර වහලය සකස් කිරීම සඳහා දැනට පවතින ස්ලැබ් එකෙන් වතුර ලීක් වන නිසා වහලය සකස් කිරීම සඳහා ඇස්තමේන්තුව සකස් කර යවන ලෙස දන්වා ඇති බවත් දක්වන ලදි.

**ඇ. සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

01 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ආර්. සමන් ඉන්දික දයාරත්න මහතා විසින්, ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.පී. දිනිඳු සම්පත් කුලතුංග මහතා ගේ නොපැමිණිම ගරු මහ සභාවට දන්වා සිටින බව ප්‍රකාශ කරන ලදි.

02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම් . සිසිර කුමාර කස්තුරිසිංහ මහතා විසින්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම් . සුසන්ත අජිත් කුමාර මහතා ගේ නොපැමිණිම ගරු මහ සභාවට දන්වා සිටින බව ප්‍රකාශ කරන ලදි.

**ඈ. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි සභාවට ඉදිරිපත් කිරීම**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එම්.බී. ස්වර්ණතිලකා මහත්මිය විසින් ,ටී.ආර්.නිලුකා ප්‍රියදර්ශනී ,ඩී52/2,උඩකණුගල,අම්තිරිගල යන ලිපිනයෙන් ලද " රජයේ ගැසට් කරන ලද මාර්ගයක් බලහත්කාරයෙන් වසා දැමීම " ලෙස ලිපියක් ඉදිරිපත් කරන ලදි.
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.එම්. ඉන්ද්‍රානි කුසුමලතා මහත්මිය විසින් ,ටී අමිල ප්‍රභාත් සෝමසිරි,එෆ්41/2,ඉඹුල්ගොඩ,ගලපිටමඩ යන ලිපිනයෙන් ලද " මාර්ගය කොන්ක්‍රීට් අතුරා දෙනමෙන් කරන ඉල්ලීමයි " ලෙස ලිපියක් ඉදිරිපත් කරන ලදි.
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ. මධුෂ සචිත් කුමාර මහතා විසින් ,එම්.එස්.එම්.නසායිස්,නො 20,යටියන්තොට පාර,කරවනැල්ල යන ලිපිනයෙන් ලද "අපගේ පෞද්ගලික ඉඩමට අපවිත්‍ර ජලය බැහැර කිරීම සම්බන්ධව " ලෙස ලිපියක් ඉදිරිපත් කරන ලදි.
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. චූලංග අනුපිය අධිකාරී මහතා විසින්,එච්.ඒ .චාමිකා ඉඳුනිල් ,බස් නැවතුම්පල,රුවන්වැල්ල යන ලිපිනයෙන් ලද "ව්‍යාපාරික ස්ථානය නිත්‍යානුකූල කිරීම " ලෙස ලිපියක් ඉදිරිපත් කරන ලදි.

ඉ. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

-නැත-

ඊ. යථා පරිදි කල් දී ඇති යෝජනා

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී. රත්නපාල පීරිස් මහතාගේ යෝජනා,</u>

<u>ඊ - 01</u>

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති සහ ගරු මන්ත්‍රීවරුන් සඳහා ලබාදෙන ගමන් ගාස්තු සහ දුරකථන දීමනාව ගරු මන්ත්‍රීතුමන්ලාගේ දීමනාවට එකතු කර ලබාදෙන ලෙස ගරු සබරගමුව ආණ්ඩුකාරතුමියගෙන් ඉල්ලා සිටිය යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කරන්නීය.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. චූලංග අනුපිය අධිකාරී මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, ගරු ප්‍රාදේශීය සභා උප සභාපති සහ ගරු මන්ත්‍රීවරුන් සඳහා ලබාදෙන ගමන් ගාස්තු සහ දුරකථන දීමනාව ගරු මන්ත්‍රීතුමන්ලාගේ දීමනාවට එකතු කර ලබාදෙන ලෙස ගරු සබරගමුව ආණ්ඩුකාරතුමියගෙන් ඉල්ලා සිටිය යුතු යැයි වන යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

<u>ඊ -02</u>

<u>ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.ඩී වෛද්‍යරත්න මහතාගේ යෝජනා,</u>

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ සේවා ගිවිසුම් මත සෞඛ්‍ය කම්කරු තනතුරේ සේවයේ නියුතු කේ.ඩී.එච්.කේ දේවගේ මියගේ සේවා ගිවිසුම 2026.02.28 දිනෙන් අවසන් වන අතර ඇයගේ 2026.01.26 දිනැති ලිපිය මඟින් ඉල්ලා ඇත්තේ ඉදිරියටත් මෙම ආයතනයේ කොන්දේසි වලට යටත්ව සේවය කිරීමට එකඟ බැවින් සේවා ගිවිසුම දීර්ඝ කර දෙන ලෙසයි.මේ සම්බන්ධයෙන් 2026.01.26 දිනැති ලේකම්තුමාගේ සටහන අනුව වාර්තා කර ඇත්තේ ,මෙම අය සේවයට පැමිණීම ,වැඩ හැසිරීම සතුටුදායක බැවින් මාස 03 ක කාලයකින් සේවා ගිවිසුම දීර්ඝ කිරීම සුදුසු බවයි.ඒ අනුව කේ.ඩී.එච් කේ දේවගේ මියගේ සේවා ගිවිසුම 2026.03.01 දින සිට 2026.05.31 දක්වා කාලය වෙනුවෙන් මහ සභාවේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කිරීමේ යෝජනාව.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ආර්. සමන් ඉන්දික දයාරත්න මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ සේවා ගිවිසුම් මත සෞඛ්‍ය කම්කරු තනතුරේ සේවයේ නියුතු කේ.ඩී.එච්.කේ දේවගේ මියගේ සේවා ගිවිසුම 2026.02.28 දිනෙන් අවසන් වන අතර, කේ.ඩී.එච් කේ දේවගේ මියගේ සේවා ගිවිසුම 2026.03.01 දින සිට 2026.05.31 දින දක්වා කාලයට දීර්ඝ කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ. මධුෂ සචිත් කුමාර මහතාගේ යෝජනා,</u>

<u>ඊ - 03</u>

රුවන්වැල්ල මහජන ක්‍රීඩාංගනය විවිධ සැනකෙලි හා සංගීත සංදර්ශණ වැනි බහුජන කටයුතු සඳහා ලබා දීමෙන් ක්‍රීඩාංගනයේ තණතිල්ල හා ධාවන පථයට බාදා සිදුවන බැවින් මහජන ක්‍රීඩාංගනය වෙනුවට විකල්ප ක්‍රීඩාංගනයක් ලෙස " එඹ වැව -එඹවත්ත ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමට හා එයට කෙටි ප්‍රවේශ මාර්ගයක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම "

මෙම කටයුත්ත සඳහා සභාවේ මුලිකත්වයෙන් අනෙකුත් අංශ සමඟ සම්බන්ධීකරණය කිරීමට කමිටුවක් පත් කර ගැනීමේ යෝජනාව.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. සුසන්ත ප්‍රියන්ජිත් මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ. මධුෂ සචිත් කුමාර මහතා විසින් අදහස් දක්වන ලද අතර මෙහිදී එඹවත්ත ක්‍රීඩාංගනය ගැසට් කර ඇති ක්‍රිඩාංගනයක් බවත් මේ ක්‍රිඩාංගනය කුලියට දීමටද හැකියාව ඇති බවත් නගරයෙන් බැහැරව තිබුනද නගරයට සමීප නිසා ,මහජන ක්‍රීඩාංගනය සංගීත සංදර්ශන වලට ආදිය ගැනීමේදී සමහරක් කාල වලදී ගැටලු මතුවන නිසා එවැනි අවස්ථා එඹවැව ක්‍රිඩාංගනයට ගෙන යාමට හා එයට ප්‍රවේශ මාර්ගයක් ලබා ගැනීම ආදිය වෙනුවෙන් යෝජනාව ගෙන ආ බව දක්වන ලදි.මෙම ස්ථානයට පාරවල් කිහිපයකින් ප්‍රවේශ විය හැකි බවද දක්වන ලදි.ප්‍රවේශ මාර්ගය සකස් කරගෙන ක්‍රිඩාංගනය නවීකරණය කර ගැනීම යෝජනාවෙහි පවතින බව දක්වන ලදි.
අනතුරුව මෙම යෝජනාව සම්බන්ධව ගරු උප සභාපති ජේ.එම්.එච්. ජයවර්ධන මහතා විසින්ද අදහස් දක්වන ලද අතර මෙම යෝජනාව කාලෝචිත යෝජනාවක් බව පෙන්වා දෙන ලදි.මෙහිදී නිශ්චිතව කමිටුවක් පත් කර ගැනීමද යෝග්‍ය වන බව පෙන්වා දෙන ලදි.

එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, මෙහිදී ගරු සභාපතිතුමා විසින් මෙයට අදාලව සකස් කෙරෙන කමිටුව සඳහා මන්ත්‍රී මණ්ඩලය ලෙස , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ. මධුෂ සචිත් කුමාර මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්. අමිත මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. වූලංග අනුපිය අධිකාරී මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.ඒ. සරත් සිරිවර්ධන මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.ඒ. උපාලි සිරිවර්ධන මහතා යන මන්ත්‍රීතුමන්ලාගෙන් සැදුම්ලත් කමිටුවක් මඟින් කාර්මික කමිටුවේදී තීරණයක් ගැනීමට යටත්ව මෙම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

## ඊ - 04

රුවන්වැල්ල නගරයේ පොදු වෙළඳ සංකීර්ණය ඉදිරිපස දැනට ත්‍රීරෝද රථ ගාල පවතින කොටස හා වෑන් රථ හා ලොරි රථ පවතින කොටස භූමි භාගය කාපට් කර විදුලි පහන් කණු යොදා සංවර්ධනය කිරීම.
එමෙන්ම මීට පෙර අවස්ථාවකදීද යෝජනා වූ පරිදි මහජන බැංකුව හා ඩී.එස්.අයි ප්‍රදර්ශනාගාරය අසලින් නිට්ටඹුව බස් නැවතුම්පල දෙසට ප්‍රවේශ මාර්ගයක් ලබා ගැනීම.
මේ සඳහා අරමුදල් ලබා ගැනීමේ කටයුතු සම්පූර්ණ වන තෙක් ප්‍රාදේශීය සභා නිළධාරින්ද ඇතුලත් කමිටුවක් මඟින් තාක්ෂණික ඇස්තමේන්තුවක් හා සැලැස්මක් සැකසීමේ කටයුතු ආරම්භ කිරීම.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. කමල් දේශප්‍රිය මුණසිංහ මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,ගරු උප සභාපති ජේ.එම්.එච්. ජයවර්ධන මහතා විසින් අදහස් පල කරන ලද අතර ,මෙම යෝජනාවටම පොදු වෙළඳපළ පිටුපස කොටසත් එක් කරන්නේනම් වඩාත් යෝග්‍ය වන බව ද රුවන්වැල්ල නගරයේ කඩ ඉදිරියේ වාහන නවතා තැබීම නිසා කඩ වැසී යන නිසාවෙන් පොදු වෙළඳපළ පිටුපස කොටස රථ ගාලක් කිරීමට හැකි වන බවද මෙහිදී දක්වන ලදි.මෙහිදී පවසන ප්‍රවේශ මාර්ගයද හොඳ යෝජනාවෙක් බවත් ඉන් කාර්යක්ෂමතාවය වැඩිවන බවද දක්වන ලද අතර මෙම යෝජනාව ඉතා කාලෝචිත යෝජනාවක් බව දක්වන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ. මධුෂ සචිත් කුමාර මහතා විසින්ද අදහස් දක්වන ලද අතර මේ වෙනුවෙන් මුදල් වෙන් කර ගැනීමට අපහසු උවත් ඇස්තමේන්තුවක් සකස් කර ගැනීම වෙනුවෙන් කටයුතු කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදි.
අනතුරුව මෙම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්,නාගරික සංවර්ධන අධිකාරිය,පුරා විද්‍යා දෙපාර්තමේන්තුව,ආදී අදාල ආයතන සමඟ සාකච්ඡා කළ යුතු බවට අදහස් පල කෙරෙමින් මෙම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී. රත්නපාල පීරිස් මහතාගේ යෝජනා,</u>

## ඊ - 05

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ 2006 අප්‍රේල් 15 වැනිදා සිට 2023 දක්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කළ ඩී.එන්.ඒ.ආර්. හතරසිංහ (අභාවක් ප්‍රාප්ත) මැතිතුමාට මෙම ගරු සභාවේ ශෝකය පල කළ යුතු යැයි යෝජනා කරන්නීය.අදාල ශෝක යෝජනාවේ පිටපතක් පවුලේ ඥාතීන් වෙත යොමු කරන්න.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. නිමල් විජේසේකර මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම් . සිසිර කුමාර කස්තුරිසිංහ මහතා විසින් ,ප්‍රදේශය වෙනුවෙන් දීර්ඝ කාලයක් වැඩ කළ මන්ත්‍රීවරයෙක් බවත් ,සාධාරණීයවත් පක්ෂයේ ජාතික තලයේ නියෝජිතයින්ගේ ඉල්ලීම පවා නොතකා සාධාරණය වෙනුවෙන් සභාවේ තීරණ වෙනුවෙන් පෙනී සිටි පුද්ගලයෙක් බවත්,එම නිසාවෙන් මෙම යෝජනාව ඉතාමත් වැදගත් යෝජනාවක් බව පෙන්වා දෙන ලදි.

අනතුරුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. චූලංග අනුපිය අධිකාරී මහතා විසින් ද මේ පිළිබඳව අදහස් දක්වන ලද අතර , ඩී.එන්.ඒ.ආර්. හතරසිංහ මහතා 2006 වසරේදී මෙම සභාවට සම්බන්ධ වූ බවත් ,ඉතාමත් සාධාරණ ලෙස කටයුතු කළ අයෙක් බවත්,සත්‍ය වෙනුවෙන් සාධාරණව කටයුතු කළ මන්ත්‍රීවරයෙක් බවත්,පක්ෂයේ මැති ඇමතිවරුන්ගේ පැත්තවත් නොගෙන තමන්ගේ හෘද සාක්ෂියට එකඟව වැඩ කළ අයෙක් බවත්,සභාවේ සෑම සිදුවීමකදීම සාධාරණව කටයුතු කළ බවත් ප්‍රදේශයේ ජනතාවත් සමඟ සුහදව කටයුතු කළ මන්ත්‍රීවරයෙක් බවත්,එතුමන්ට නිවන් සුව ප්‍රාර්ථනා කරන බවත්,පවුලේ ඥාතීන් වෙනුවෙන් ශෝකය පල කරන බවත් දක්වන ලදි.

අනතුරුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ ඉන්දික ජයලත් වේරගොඩ මහතා විසින් ඩී.එන්.ඒ.ආර්. හතරසිංහ මහතා ඉතා කීර්තිමත් දේශපාලඥයකු වන බවත් ,ඉතා නිහතමානී අවංක මන්ත්‍රීවරයෙක් බවත් ,ප්‍රදේශයට ඉතා විශාල වැඩ කොටසක් කළ මන්ත්‍රීවරයෙක් බවත් එය අදටත් ගෝනගල්දෙනිය ප්‍රදේශයේ දැක ගන්නට තිබෙන බවත්,එම නිසා එතුමන්ට නිවන් සුව අත්වේවා කියා ප්‍රාර්ථනා කරන බවත්,එතුමාගේ ඥාතීන්ට අපගේ ශෝකය ප්‍රකාශ කරන බවත් දක්වන ලදි.

අනතුරුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ආර්.ඒ. චන්ද්‍ර පුෂ්ප කාන්ති මහත්මිය විසින්, ඩී.එන්.ඒ.ආර්. හතරසිංහ මහතා,නිහඬ නිහතමානී චරිතයක් බවත්,සභාවේදී අවශ්‍ය වේලාවේදී පමණක් කථා කරන කෙනෙක් බවත්,සුහදව කටයුතු කරන කෙනෙක් බවත් එතුමන්ට නිවන් සුව ප්‍රාර්ථනා කරන බවත්,පවුලේ අය වෙනුවෙන් ශෝකය පල කිරීම කාලෝචිත වන බවත් දක්වන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. සුසන්ත ප්‍රියන්ජිත් මහතා විසින්,ඩී.එන්.ඒ.ආර්. හතරසිංහ මහතා තමාගේ ප්‍රදේශය තුළ වැඩිම කාලයක් සභාව නියෝජනය කළ මන්ත්‍රීවරයා බවත්,සුහදශීලීත්වය,පිරිසක් පාලනය කරගෙන සිටීමට තිබූ ඥාණය අප විසින් දැක ඇති හොඳම ලක්ෂණයක් බවත්,දේශපාලනය කළ පුද්ගලයෙක් ලෙස තම දේශපාලන ජීවිතය තුළ තෝරා ගත් පිරිසක් සමඟ වැඩ නොකල ඉතාමත්ව නිවැරදිව දේශපාලනය හැසිරවූ දේශපාලඥයකු බවත්, විශාල වැඩ කොටසක් කිරීමට නායකත්වය දී ඇති බවත්,එතුමන්ට නිවන් සුව ප්‍රාර්ථනා කරන බවත් දක්වන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී. රත්නපාල පීරිස් මහතා විසින්,ඩී.එන්.ඒ.ආර්.හතරසිංහ මහතා,තමාගේ කල්‍යාණ මිත්‍රයෙක් බවත්,සෑම කටයුත්තකදීම එක්ව කටයුතු කළ පුද්ගලයෙක් බවත්,එමෙන්ම පොදුජන එක්සත් පෙරමුණ යටතේ සන්ධානා ගත වූ විට ඔහු ලංකා සම සමාජ පක්ෂය නියෝජනය කළ බවත්,සම සමාජ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට පක්ෂයේ ගෞරවයත් එතුමාගේ ගෞරවයටත් හානියක් ඇති නොවන ලෙස කැපවීමෙන් කටයුතු සිදු කළ බවත්,ඔහු සමඟ තමා මේ ප්‍රාදේශීය සභාවේ 2026.අප්‍රේල් මස 15 වැනිදා මුලින්ම මේ සභාවට සහභාගී වුණු බවත්,එතුමන් සෑම අවස්ථාවකදීම නීතියට ගරු කළ බවත්,නිහතමානීව කටයුතු කළ චරිතයක් බවත්,ප්‍රාදේශීය සභාවේ නීති රීතිවලට පරිබාහිරව කටයුතු නොකල බවත්,අනවශ්‍ය ලෙස හැසිරීමක් සිදු නොකල බවත්,සියලු සංවර්ධන කටයුතු වලදී දිගු කාලීනව සිතා කටයුතු කළ බවත්,ගෝනගල්දෙනිය ග්‍රාමීය රෝහල සංවර්ධනය කිරීමේ දී එම කමිටුවට නායකත්වය දෙමින් ප්‍රදේශයට වැඩදායි ඵලදායී ලෙස කටයුතු කළ බව විශේෂයෙන්ම මතක් කළ යුතුවන බව දක්වන ලදි.ප්‍රදේශයේ සංවර්ධනයට මිනිසුන්ගේ එදිනෙදා පැවැත්ම වෙනුවෙන් නායකත්වය දෙමින් කැපවීමෙන් කටයුතු කළ මේ මන්ත්‍රීතුමාගේ අභාවය අප සියලුදෙනාටම පාඩුවක් වන බවත් අවසන් වශයෙන් මේ සභාව වෙනුවෙන් නිවන් සුව ප්‍රාර්ථනා කරන බව ප්‍රකාශ කරන ලදි.

ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යාරත්න මහතා විසින් ,වැඩි දෙනෙක් මෙතුමාගේ කාල සීමාවේ නොසාටි නිසා මෙතුමන් ගැන නොදන්නා බවත්,තමාද 20218 සිට 2023 දක්වා කාල සීමාව තුළ එතුමා සමඟ කටයුතු කළ බවත්, ඩී.එන්.ඒ.ආර්.හතරසිංහ මහතා නිහතමානී ගැටුම්කාරී නොවන චරිතයක් බවත්,ප්‍රාදේශීය සභාව වශයෙන් මෙතුමාගේ අභාවය දැනගත් පසු අවශ්‍ය කටයුතුත් එතුමාට ගෞරවයක් වශයෙන් කළ යුතු දේවල්ද කළ බවත්,මේ ප්‍රදේශය වෙනුවෙන් මහන්සි වී වැඩ කළ අයෙකු බවත්,එමෙන්ම නිසි ගෞරවය තැබිය යුතුයි යන අදහස ඇතිව අභාවයෙන් පසු පළමු මොහොතේ සිටම කටයුතු කළ බවත්,ආදාහන කටයුතු සඳහා අවශ්‍ය සියල්ල සඳහා අප විසින් සහයෝගය ලබා දුන් බවත්,එතුමන් දේශපාලනිකව ගත් විට දේශපාලන පක්ෂයක් තුළ එල්බගෙන නොසිටි අයෙක් බවත්,චරිතයක් ලෙස නැවත ස්මරණය කළ යුතු චරිතයක් බවත්,එම නිසා මෙම යෝජනාව ගෙනඒම පිළිබඳව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී. රත්නපාල පීරිස් මහතාට අපගේ කෘතඥතාවය පල කරන බව දක්වන ලදි.

ඒ අනුව එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ 2006 අප්‍රේල් 15 වැනිදා සිට 2023 දක්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කළ ඩී.එන්.ඒ.ආර්. හතරසිංහ (අභාවක් ප්‍රාප්ත) මැතිතුමාට මෙම ගරු සභාවේ ශෝකය පලකිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**<u>ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.ඩී වෛද්‍යාරත්න මහතාගේ යෝජනා,</u>**

**<u>ඊ - 06</u>**

සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 2316/20 සහ 2023 ජනවාරි මස 24 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති " සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභා විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටු මාවත් වල සැලසුම් පිළියෙල කිරීම හා නාම ලේඛණය දක්වමින් දැන්වීම් පල කිරීම පිළිබඳ නියෝග" මාලාවෙහි කරන ලද නියම සහ 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තියෙන් කරන ලද නියමය යටතේ ,2025.09.11 දිනැති ඊ-15 දරණ රුවන්වැල්ල ප්‍රා .ස ගරු මහා සභා තීරණය අනුව 2025.10.17 දින 2458/50 අංක දරණ ගැසට් පත්‍රයෙහි පල කරනු ලැබ ඇති නිවේදනයේ උප ලේඛණයේ ඇතුලත් නාම ලේඛණයේ දැක්වෙන පාරවල් සහ පටු මාවත් අතරින් නිසි අධිකරණයේ නඩු පවරා නැති සහ මෙහි පහත උපලේඛණයේ ඇතුලත් පාරවල් හා පටු මාවත් රුවන්වැල්ල ප්‍රා.ස සතු පාරවල් සහ පටු මාවත් වශයෙන් තහවුරු කළ යුතු බව රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ජී.වී. රුවිනි ලක්ෂ්මී ප්‍රියදර්ශිනී මහත්මිය විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.එම්. ශ්‍රී සාන්ති කුමාරි දිසානායක මෙනවිය විසින් අදහස් දක්වන ලද අතර මෙම මාර්ග ගැසට් කිරීම ඉතා හොඳ යෝජනාවක් බව පෙන්වා දෙන ලදි. මෙම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 2316/20 සහ 2023 ජනවාරි මස 24 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති " සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභා විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටු මාවත් වල සැලසුම් පිළියෙල කිරීම හා නාම ලේඛණය දක්වමින් දැන්වීම් පල කිරීම පිළිබඳ නියෝග" මාලාවෙහි කරන ලද නියම සහ 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තියෙන් කරන ලද නියමය යටතේ ,2025.09.11 දිනැති ඊ-15 දරණ රුවන්වැල්ල ප්‍රා .ස ගරු මහා සභා තීරණය අනුව 2025.10.17 දින 2458/50 අංක දරණ ගැසට් පත්‍රයෙහි පල කරනු ලැබ ඇති නිවේදනයේ උප ලේඛණයේ ඇතුලත් නාම ලේඛණයේ දැක්වෙන පාරවල් සහ පටු මාවත් අතරින් නිසි අධිකරණයේ නඩු පවරා නැති සහ මෙහි පහත උපලේඛණයේ ඇතුලත් පාරවල් හා පටු මාවත් රුවන්වැල්ල ප්‍රා.ස සතු පාරවල් සහ පටු මාවත් වශයෙන් තහවුරු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**<u>ඊ - 07</u>**

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ සේවා ගිවිසුම් මත සෞඛ්‍ය කම්කරු තනතුරේ සේවයේ නියුතු එස්.ඒ.ඩී කේ අමරසිංහ මයාගේ සේවා ගිවිසුම 2026.02.24 දිනෙන් අවසන් වන බැවින් ඔහුගේ 2026.01.26 දිනැති ලිපිය මඟින් ඉල්ලා ඇත්තේ ,මෙම ආයතනයේ කොන්දේසි වලට යටත්ව සෞඛ්‍ය කම්කරු තනතුරේ ඉදිරියටත් සේවය කිරීමට එකඟ බැවින් සේවා ගිවිසුම දිර්ඝ කරදෙන ලෙසයි.මේ සම්බන්ධයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා වාර්තා කර ඇත්තේ ,මොහුගේ වැඩ පැමිණීම හා හැසිරීම සතුටුදායක අතර ,අම්තිරිගල නගරයේ කසල කළමණාකරණ කටයුතු වල යෙදෙන බැවින් ඉදිරියටත් මොහුගේ සේවය අවශ්‍ය නිසා සේවා ගිවිසුම දීර්ඝ කිරීම

සුදුසු බවයි.ඒ අනුව එස්.ඒ.ඩී කේ අමරසිංහ මයාගේ සේවා ගිවිසුම2026.02.25 දින සිට 2026.05.24 දින දක්වා කාලයට දීර්ඝ කිරීමට මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කිරීමේ යෝජනාව.
මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ජී. සුදත් අනුර උඩුමල්වත්ත මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ සේවා ගිවිසුම් මත සෞඛ්‍ය කම්කරු තනතුරේ සේවයේ නියුතු එස්.ඒ.ඩී කේ අමරසිංහ මයාගේ සේවා ගිවිසුම 2026.02.24 දිනෙන් අවසන් වන බැවින් එස්.ඒ.ඩී කේ අමරසිංහ මයාගේ සේවා ගිවිසුම 2026.02.25 දින සිට 2026.05.24 දින දක්වා කාලයට දීර්ඝ කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**<u>ඊ - 08</u>**

පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/LG/4/1/13-11 හා 2026.01.07 දිනැති ලිපිය මඟින් දන්වා ඇත්තේ ,රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව සඳහා සභා අරමුදලින් වැය දරමින් සේවා අවශ්‍යතාව මත ස්ථිර සේවය සඳහා හිමිකම් නොඉල්ලන බවට මාස තුනෙන් තුනට සේවය බණ්ඩනය වන පරිදි ගිවිසුම අලුත් වන ආකාරයට රියදුරෙකුගේ කාර්ය භාරය ඉටුකර ගැනීමට සේවකයකු තත්කාර්ය පදනම මත සේවයේ යොදවා ගැනීමට ගරු ආණ්ඩුකාරතුමිය අනුමැතිය ලබා දී ඇති බවයි.දැනට සේවා ගිවිසුම් මත සේවයේ නියුතු සේවකයන් සඳහා ගෙවන දෛනික දීමනාව රු.1318.00ක් වන අතර සෞඛ්‍ය කම්කරු ,වැඩ ක්ෂේත්‍ර කම්කරු ආදාහනාගාර සහයක යන PL 01 කාණ්ඩයේ තනතුරු සඳහා එම දීමනාව ගෙවනු ලබයි.රියදුරු තනතුර ප්‍රාථමික ශිල්පීය මට්ටමේ PL 03 කාණ්ඩයේ තනතුරක් වන අතර ,ඒ වෙනුවෙනු වර්තමාන මිල ගණන්ද සලකා බලා සාධාරණ දෛනික වැටුපක් ගෙවිය යුතු බැවින් ,රා.ප.ච10/2025 හි 2026.01.01 දිනට PL 03 වැටුප් කාණ්ඩයේ III ශ්‍රේණියට නියමිත ආරම්භක වැටුප හා ජීවන වියදම් දීමනාව (41209+17800 =රු.59009.00 ) අනුව රියදුරු තනතුර සඳහා බඳවා ගන්නා සේවකයන් වෙනුවෙන් දෛනික දීමනාව රු.1966.00ක දීමනාවක් ගෙවීම සුදුසු බවත් ,ඒ සඳහා මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවත් යෝජනා කරමි.
මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්. අමිත මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/LG/4/1/13-11 හා 2026.01.07 දිනැති ලිපිය මඟින් දන්වා ඇත්තේ ,රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව සඳහා සභා අරමුදලින් වැය දරමින් සේවා අවශ්‍යතාව මත ස්ථිර සේවය සඳහා හිමිකම් නොඉල්ලන බවට මාස තුනෙන් තුනට සේවය බණ්ඩනය වන පරිදි ගිවිසුම අලුත් වන ආකාරයට රියදුරෙකුගේ කාර්ය භාරය ඉටුකර ගැනීමට සේවකයකු තත්කාර්ය පදනම මත සේවයේ යොදවා ගැනීමට ගරු ආණ්ඩුකාරතුමිය අනුමැතිය ලබා දී ඇති බවයි.දැනට සේවා ගිවිසුම් මත සේවයේ නියුතු සේවකයන් සඳහා ගෙවන දෛනික දීමනාව රු.1318.00ක් වන අතර සෞඛ්‍ය කම්කරු ,වැඩ ක්ෂේත්‍ර කම්කරු ආදාහනාගාර සහයක යන PL 01 කාණ්ඩයේ තනතුරු සඳහා එම දීමනාව ගෙවනු ලබයි.රියදුරු තනතුර ප්‍රාථමික ශිල්පීය මට්ටමේ PL 03 කාණ්ඩයේ තනතුරක් වන අතර ,ඒ වෙනුවෙනු වර්තමාන මිල ගණන්ද සලකා බලා සාධාරණ දෛනික වැටුපක් ගෙවිය යුතු බැවින් ,රා.ප.ච10/2025 හි 2026.01.01 දිනට PL 03 වැටුප් කාණ්ඩයේ III ශ්‍රේණියට නියමිත ආරම්භක වැටුප හා ජීවන වියදම් දීමනාව (41209+17800 =රු.59009.00 ) අනුව රියදුරු තනතුර සඳහා බඳවා ගන්නා සේවකයන් වෙනුවෙන් දෛනික දීමනාව රු.1966.00ක දීමනාවක් ගෙවීම සුදුසු බවත් ,ඒ සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවත් ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**<u>ඊ -09</u>**

නො A/134/2 ,ගල්පාත,රුවන්වැල්ල ලිපිනයේ පදිංචි G.M.ශෂිනි දිල්ෂානි අපොන්සු සිසුවිය අප ආයතනයේ ප්‍රායෝගික පරිගණක පුහුණුව සඳහා අයදුම්කර ඇත.101(09) වැය ශීර්ෂයේ වෙන්කළ මුදල් ප්‍රමාණවත් නොවන බැවින් මෙම සිසුවිය හට ගෙවීම් රහිතව ස්වේච්චා පුහුණු අවස්ථාව ලබාදීම සඳහා ගරු මහා සභාවේ අනුමැතියට ඉදිරිපත් කරන යෝජනාවයි.පුහුණු කාලය 2026.02.13 සිට 2026.08.13 දක්වා මාස 06 කි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ. මධුෂ සචිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්,නො A/134/2

,ගල්පාත,රුවන්වැල්ල ලිපිනයේ පදිංචි G.M.ශෂිනි දිල්ෂානි අපොන්සු සිසුවිය අප ආයතනයේ ප්‍රායෝගික පරිගණක පුහුණුව සඳහා101(09) වැය ශීර්ෂයේ වෙන්කළ මුදල් ප්‍රමාණවත් නොවන බැවින්,මෙම සිසුවිය හට ගෙවීම් රහිතව ස්වේච්ඡා පුහුණු අවස්ථාව ලබාදීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි. පුහුණු කාලය 2026.02.13 සිට 2026.08.13 දක්වා මාස 06 කි.

**ඊ-10**

නො A 145/3 ගල්පාත ,රුවන්වැල්ල ලිපිනයේ පදිංචි K.A.කවීෂා අස්වැල්ල සිසුවිය අප ආයතනයේ ප්‍රායෝගික පරිගණක පුහුණුවකට ඉල්ලුම් කර ඇත.ඒ අනුව ඇයට අප ආයතනයේ පුහුණු අවස්ථාව ලබා දීමටත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2017 (II) ට අනුව වැඩකරන දිනකට රු.1000.00ක දීමනාවක් ගෙවීමටත් අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු මහා සභාවට ඉදිරිපත් කරන යෝජනාවයි.
2026 අයවැයට අනුව (101)9 වැය ශීර්ෂයේ රු.250,000.00 ක මුදලක් වෙන්කර ඇත.පුහුණු කාලය 2026.02.13 සිට 2026.08.13 දක්වා මාස 06 කි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී. රත්නපාල පීරිස් මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, නො A 145/3 ගල්පාත ,රුවන්වැල්ල ලිපිනයේ පදිංචි K.A.කවීෂා අස්වැල්ල සිසුවිය හට අප ආයතනයේ පුහුණු අවස්ථාව ලබා දීමටත්,රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2017 (II) ට අනුව වැඩකරන දිනකට රු.1000.00ක දීමනාවක් ගෙවීමටත්, අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.
2026 අයවැයට අනුව (101)9 වැය ශීර්ෂයේ රු.250,000.00 ක මුදලක් වෙන්කර ඇත.පුහුණු කාලය 2026.02.13 සිට 2026.08.13 දක්වා මාස 06 කි.

**ඊ -11**

සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුඥාත අංක 810-60-03-2102(1)13 මඟින් අම්තිරිගල හා ගෝනගල්දෙනිය පුස්තකාලවල අන්තර්ජාල පහසුකම් හා පරිගණක සවි කිරීම සඳහා වැඩ වියදම රු. 743842.42 ක මුදලක් වෙන්කර තිබුණි.ඒ අනුව 2025.12.16 දින ප්‍රසම්පාදන තීරණය පරිදි මහනුවර බේස් HP ආයතනයෙන් සැපයුම් සිදු කරන ලදි.මෙතෙක් අනුඥාත කරන ලද මුදල මෙම කාර්යාලය වෙත ලැබී නැත.සැපයුම් සිදු කළ දිනය 2025.12.23වන බැවින් දීර්ඝ කාලයක් ගතව ඇත.අදාල සැපයුම් ආයතනය මඟින්,පිරිවැය වූ රු.657732.00(+VAT)ක මුදල ඉල්ලා සිටියි.එබැවින් ඉහත මුදල ප්‍රධාන අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය වනතුරු අප ආයතනයේ ගෙවීම් ශීර්ෂ මඟින් ගෙවීමට අනුමැතිය පතමි.දැනට පුස්තකාල/පෙර පාසල් /ක්‍රීඩාංගනය වැය ශීර්ෂයේ ලක්ෂ අටක (08) මුදලක්ද සංවර්ධන ප්‍රතිපාදන ලැබීම් තැන්පත් ලෙස රු .252000.00ක මුදලක්ද පවතී.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එම්.බී. ස්වර්ණතිලකා මහත්මිය විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී. රත්නපාල පීරිස් මහතා විසින් මෙම යෝජනාව සම්බන්ධව,තමාගේ විරුද්දත්වය ප්‍රකාශ කරන බව සටහන් කර ගන්නා මෙන් ඉල්ලා සිටින ලදි.ඒ අනුව ඊ 11 යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුඥාත අංක 810-60-03-2102(1)13 මඟින් අම්තිරිගල හා ගෝනගල්දෙනිය පුස්තකාලවල අන්තර්ජාල පහසුකම් හා පරිගණක සවි කිරීම සඳහා වැඩ වියදම රු. 743842.42 ක මුදලක් වෙන්කර තිබුණි.ඒ අනුව 2025.12.16 දින ප්‍රසම්පාදන තීරණය පරිදි මහනුවර බේස් HP ආයතනයෙන් සැපයුම් සිදු කරන ලදි.මෙතෙක් අනුඥාත කරන ලද මුදල මෙම කාර්යාලය වෙත ලැබී නැත.සැපයුම් සිදු කළ දිනය 2025.12.23වන බැවින් දීර්ඝ කාලයක් ගතව ඇත.අදාල සැපයුම් ආයතනය මඟින්,පිරිවැය වූ රු.657732.00(+VAT)ක මුදල ඉල්ලා සිටියි.එබැවින් ඉහත මුදල ප්‍රධාන අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය වනතුරු අප ආයතනයේ ගෙවීම් ශීර්ෂ මඟින් ගෙවීමට අනුමැතිය ලබා දීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**ඊ- 12**

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට අයත් නිට්ටඹුව බස් නැවතුම්පොල පිහිටි කඩ කාමර 31 ක් සඳහා තක්සේරු වාර්තාව ලැබී ඇත.එම තක්සේරුව ක්‍රියාත්මක කරනු ලබන්නේ කුමන මාසයේ සිටද යන්නත් එම තන්සේරුව ක්‍රියාත්මක කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කිරීමේ යෝජනාව.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. මහිලාල් සුමිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,මෙහිදී සුදුසු දිනයක් යොදා ගනිමුයි යන්න ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්. අමිත මහතා ප්‍රකාශ කරන ලද අතර,ගරු සභාපතිතුමා විසින් 2026.03.01 දින සිට ක්‍රියාත්මක කිරීම සුදුසු වන්නේදැයි විමසන ලද අතර, එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්,රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට අයත් නිට්ටඹුව බස් නැවතුම්පොල පිහිටි කඩ කාමර 31 ක් සඳහා තක්සේරු වාර්තාව ලැබී ඇති බැවින්,එම තක්සේරුව 2026.මාර්තු මස 01 දින සිට ක්‍රියාත්මක කිරීම දුසුදු බවත්,එම තක්සේරුව ක්‍රියාත්මක කිරීම දුසුදු බවත්, ඒකමතිකව සහා සම්මත වු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**<u>ඊ- 13</u>**

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට අයත් අඟුරුවැල්ල පිහිටි වම්පස කඩ කාමර 09 ක් සඳහා තක්සේරු වාර්තාව ලැබී ඇති බැවින් එම තක්සේරුව ක්‍රියාත්මක කරනු ලබන්නේ කුමන මාසයේ සිටද යන්නත් එම තක්සේරුව ක්‍රියාත්මක කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කිරීමේ යෝජනාවයි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්. මොහොමඩ් රසියා සකාෆ් මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාවට අදාලව දිනයද 2026.03.01 දිනයම යොදා ගැනීම සුදුසු වන බව පෙන්වා දෙමින්ම,මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට අයත් අඟුරුවැල්ල පිහිටි වම්පස කඩ කාමර 09 ක් සඳහා තක්සේරු වාර්තාව ලැබී ඇති බැවින් එම තක්සේරුව ක්‍රියාත්මක කිරීම 2026.මාර්තු මස 01 දින සිට ක්‍රියාත්මක කිරීම සුදුසු බවත්, එම තක්සේරුව ක්‍රියාත්මක කිරීම සුදුසු බවත්, ඒකමතිකව සහා සම්මත වු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**<u>ඊ- 14</u>**

2025.11.28 හා 29 යන දින වලදී දිවයින පුරා පැවති "දිට්වා "සුළි කුණාටු තත්වය හේතුවෙන් රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට බලපෑ අධික ගංවතුර තත්වයෙන් හානියට පත් වූ ජන ජීවිතය යථාවත් කිරීම සඳහා විවිධ කාර්යන් සිදු කිරීමට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට සිදු විය.ඒ සඳහා රු.2455698.54 ක වියදමක් දැරීමට සිදු විය.මෙම මුදල සබරගමුව පළාත් සභාවෙන් අප ආයතනය වෙත ලබා දුන් අතර ඊට අදාළ පළාත් පාලන කොමසාරිස් විසින් නිකුත් කළ අංක CLG/AD/04/08(වෙලුම 02)හා 2026.01.12 දිනැති ලිපිය අනුව එකී ගෙවීම පිළිබඳව ගරු මහා සභාවේ දැනුවත් කිරීමත් ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමත් සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කරමි.මෙහිදී රු.ලක්ෂ 05 ක උපරිම සීමාව ඉක්මවූ "තනි වව්වරයක් නොමැතිකම" ගරු මහා සභාවේ දැනුවත් වීම සහ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

වාහන කුලිය හා ඉන්දන සඳහා =රු 1813500.00

අතිකාල සඳහා =රු.35308.54

සැපයුම් සඳහා=රු.606890.00

මුලු මුදල=රු.2455698.54

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එන්. අරුන ශාන්ත වීරසේකර මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාවෙහි " තනි වව්වරයක් නොමැති බව "ලෙස වෙනස් වීමක් සිදු විය යුතු බවද පෙන්වා දෙමින්, මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, 2025.11.28 හා 29 යන දින වලදී දිවයින පුරා පැවති "දිට්වා "සුළි කුණාටු තත්වය හේතුවෙන් රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට බලපෑ අධික ගංවතුර තත්වයෙන් හානියට පත් වූ ජන ජීවිතය යථාවත් කිරීම සඳහා විවිධ කාර්යන් සිදු

කිරීමට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට සිදු විය.ඒ සඳහා රු.2455698.54 ක වියදමක් දැරීමට සිදු විය.මෙම මුදල සබරගමුව පළාත් සභාවෙන් අප ආයතනය වෙත ලබා දුන් අතර ඊට අදාළ පළාත් පාලන කොමසාරිස් විසින් නිකුත් කළ අංක CLG/AD/04/08(වෙලුම 02)හා 2026.01.12 දිනැති ලිපිය අනුව එකී ගෙවීම පිළිබඳව ගරු මහා සභාවේ දැනුවත් කිරීමත් ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමත් සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කරමි.මෙහිදී රු.ලක්ෂ 05 ක උපරිම සීමාව ඉක්මවූ "තනි වව්චරයක් නොමැතිකම" ගරු මහා සභාවේ දැනුවත් වීම සහ අනුමැතිය සඳහා ඉදිරිපත් වූ යෝජනාව

වාහන කුලිය හා ඉන්දන සඳහා =රු 1813500.00

අතිකාල සඳහා =රු.35308.54

සැපයුම් සඳහා=රු.606890.00

මුලු මුදල=රු.2455698.54

මෙහි දක්වා ඇති මුදල්මය වටිනාකම අනුව, අනුමැතිය ලබා දීම සුදුසු බව, ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**ඊ-15**

ප්‍රාදේශීය සභාව මඟින් සපයනු ලබන සේවා වලට අදාලව ලබාදෙනු ලබන අයදුම් පත සඳහා මේ වන විට ගාස්තු අය කිරීමක් සිදු කරනු ලබයි.අප ආයතනයේ නිල වෙබ් අඩවිය සඳහා මෙම අයදුම් පත්‍ර උඩුගත(UPLOAD) කළ යුතුව ඇති අතර මහජනතාවට ඒ හරහා මාර්ගගතව අයදුම් පත්‍ර බාගත කරගත හැක.එලෙස බාගත කර ගන්නා අයදුම් පත්‍ර වලට අදාලව ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් ගරු මහා සභාවේ සාකච්ජා කර තීරණයක් ලබා ගැනීම වෙනුවෙන් ඉදිරිපත් කරන යෝජනාවයි.(ඇමුණුම් අංක 01)

| විස්තරය | ගාස්තුව (රු.) |
|---|---|
| නාගරික ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමේ අයදුම්පත්‍රය | **1200.00** |
| නාගරික නොවන ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමේ අයදුම්පත්‍රය | **750.00** |
| අනුකූලතා සහතිකය සඳහා වන අයදුම්පත්‍රය | **200.00** |
| ප්‍රාදේශීය සභා පොදු සුසාන භූමිවල භූමිදාන සිදු කිරීම සඳහා වන අයදුම්පත්‍රය | **200.00** |
| විථිරේඛා හා නොපවරා ගැනීමේ සහතිකයක් ලබා ගැනීම සඳහා වන අයදුම්පත්‍රය | **200.00** |
| නාගරික ඉඩම් අනු කොටස් අනුමත කර ගැනීමේ අයදුම්පත්‍රය | **1200.00** |
| නාගරික නොවන ඉඩම් අනු කොටස් අනුමත කර ගැනීමේ අයදුම්පත්‍රය | **500.00** |
| වරිපනම් ලේඛණයේ නම සංශෝධනය සඳහා ඉල්ලුම්පත | **200.00** |
| අනතුරුදායක ගස් ඉවත් කිරීම සඳහා අයදුම්පත | |
| ඉවත් කිරීමට බලපත්‍ර ලබා ගත යුතු ගස් සඳහා | **2000.00** |
| ඉවත් කිරීමට බලපත්‍ර ලබා නොගත යුතු ගස් සඳහා | **1000.00** |
| පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමේ අයදුම්පත්‍රය | **200.00** |
| පාරිසරික ආරක්ෂණ බලපත්‍රය වසර 03කට වරක් අලුත් කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය | **150.00** |

| | |
|---|---|
| මහජන පුස්තකාල සමාජිකත්වය ලබා ගැනීම/ අලුත් කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය<br>වැඩිහිටි<br>ළමා | <br>**25.00**<br>**10.00** |
| ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශය ලබා ගැනීමේ අයදුම්පත්‍රය (BA අයදුම්පත්‍රය) | **100.00** |
| ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශය ලබා ගැනීමේ අයදුම්පත්‍රය (LA අයදුම්පත්‍රය) | **100.00** |
| ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශය ලබා ගැනීමේ අයදුම්පත්‍රය (PA අයදුම්පත්‍රය) | **100.00** |
| වෙළඳ බලපත්‍රය ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය<br>(ප්‍රාදේශීය සභාවට පැමිණ සම්පූර්ණ කළ යුතුය) | **-** |
| පාපැදි බලපත්‍ර අයදුම්පත්‍රය | **ගාස්තු අය නොකෙරේ.** |
| බැකෝ ලෝඩරය කුලියට ඉල්ලා ගැනීමේ අයදුම්පත්‍රය | **ගාස්තු අය නොකෙරේ.** |
| ගලි බවුසරයේ සේවා ලබා ගැනීම සඳහා වන අයදුම්පත්‍රය | **ගාස්තු අය නොකෙරේ.** |
| ක්‍රීඩා පිටිය වෙන් කර ගැනීමේ අයදුම්පත | **ගාස්තු අය නොකෙරේ.** |
| ජල බවුසරය ලබා ගැනීමේ අයදුම්පත්‍රය | **ගාස්තු අය නොකෙරේ.** |
| කුලියට දෙන භාණ්ඩ ලබා ගැනීමේ ඉල්ලුම් පත්‍රය | **ගාස්තු අය නොකෙරේ.** |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. සුදත් හේමන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස,ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී. රත්නපාල පීරිස් මහතා විසින් අනතුරුදායක ගස් සම්බන්ධ ගාස්තු වලදී ඉවත් කිරීමට බලපත්‍ර ලබාගතයුතු ගස් සඳහා රු.2000.00 ද ඉවත් කිරීමට බලපත්‍ර ලබානොගතයුතු ගස් සඳහා 1000.00 ලෙස දැක්වීම නොගැලපෙන බව දක්වන ලදි.
මෙම යෝජනාව සම්බන්ධව සාකච්ජා කර ගැනීම සඳහා කාරක සභා අවස්ථාවක් ඇති කර ගැනීම යෝග්‍ය වන බවත් මේ සඳහා යෝජනා කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් පෙන්වා දෙන ලදි.
ඒ අනුව පෙ.ව 10.58 පමණ ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් කර ගැනීම සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. වූලංග අනුපිය අධිකාරී මහතා යෝජනා කළ අතර මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම් . සිසිර කුමාර කස්තුරිසිංහ මහතා විසින් ස්ථිර කරන ලදි.

අනතුරුව පෙ.ව 11.00 පමණ ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ආර්.ජ්. සෙනරත් බංඩාර රාජපක්ෂ මහතා විසින් කාරක සභා අවස්ථාව අවසන් කිරීමට යෝජනා කළ අතර,එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජ් ඉන්දික ජයලත් වේරගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව ,කාරක සභා අවස්ථාව අවසන් වෙමින්, නැවතත් ගරු මහා සභාවේ වැඩ කටයුතු සිදු කරන ලදි.

අනතුරුව එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්,අන්තර්ජාලයෙන් බාගත කර මුද්‍රණය කරගෙන කාර්යාලය වෙත යම් සේවාවක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ,යෝජනාවට අදාල ඉදිරිපත් කරන ලද ඇමුණුමේ සඳහන් ගාස්තු අය කරගෙන,අයදුම්පත සඳහා සේවා ගාස්තුවක් අය කළ යුතු බවට,සුදුසු බව ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි

**<u>ඊ- 16</u>**

2025.12.11 දිනැති මහා සභා තීරණය අනුව නාගරික සංවර්ධන අධිකාරිය ,මාර්ග සංවර්ධන අධිකාරිය,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ,පොලිසිය,සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය යන ආයතනවළ ඇමුණුමේ සඳහන් නිළධාරීන්ගේ සහභාගීත්වයෙන් 2026.01.23 දින රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අනවසර ඉදි කිරීම් සම්බන්ධව නිර්දේශ සහ තීරණ ගැනීම සඳහා විශේෂ කමිටුවක් පැවැත්විණි.එහිදී සියලු පාර්ෂවයන්ගේ ඒකමතික එකඟතාවය මත පහත සඳහන් තීරණ වලට එළඹිණි.ඒ අනුව කටයුතු කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමේ යෝජනාව.(ඇමුණුම් අංක 06)

- කරවනැල්ල සිට කන්නත්තොට දක්වා ප්‍රධාන මාර්ගය දෙපස අනවසර ඉදිකිරීම් සහ ව්‍යාපාර ඉවත් කර ගැනීම සඳහා 2026.04.24 දිනට පෙර ඒවා ඉවත් කර ගැනීමට ලිඛිතව දැනුම් දීම.
- එලෙස කරනු ලබන දැනුම් දීම අනුව ඉවත්කර නොගන්නා අනවසර ඉදි කිරීම් 2026.04.24 දිනෙන් පසුව පහත සඳහන් ආයතනවල ඒකාබද්දව මෙහෙයවීමෙන් ඉවත් කිරීමට කටයුතු කිරීම.(මාර්ග සං.අධිකාරිය,ප්‍රා .ලේ.කාර්යාලය,පොලීසිය,සෞඛ්‍ය වෛද්‍ය නි.කාර්යාලය,රු.ප්‍රා.ස)
- දැනට හඳුනාගෙන ඇති අනවසර ඉදිකිරීම් /ව්‍යාපාර වලට අමතරව තවදුරටත් අලුතින් කළ අනවසර ඉදි කිරීම් තිබේනම් ඒවා ද ඉහත ක්‍රියාමාර්ග අනුව කටයුතු කිරීම.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. නිමල් විජේසේකර මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස,ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම් . සිසිර කුමාර කස්තුරිසිංහ මහතා විසින් මේ ප්‍රදේශය ගත්තොත් ගොඩක් පිරිසක් ජීවත්වෙන ආදායම් මාර්ගයක් අහිමි වෙන බවත්,මෙය සිදු කරන ගමන් මේ සඳහා වෙනත් විකල්ප යෝජනාවක් ගෙන ඒම සුදුසු වන බව පෙන්වා දෙන ලදි.ජන ජීවිතයට මෙය බලපැමක් ඇතිකරන නිසා වෙනත් විකල්ප ක්‍රමයක්ද යොදා ගැනීම සුදුසු වන බව පෙන්වා දෙන ලදි.

මෙම යෝජනාව පිළිබඳව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එස්. මොහොමඩ් රසියා සකාෆ් මහතා විසින් අදහස් දක්වන ලද අතර මින් ඉදිරියට තිබෙන ඒවා තිබෙන විටම මෙය කාගේ හෝ හයියක් අරන් කරන වැඩක් නොවිය යුතු බවත්,මින් පසුව අලුතින් ඉදි කරන්න ඉඩ නොදීමට කටයුතු කරන ලෙසත් ,ඉවත් කිරීමට ගිය පසු ගැටලුවකටද මුහුණ දීමට සිදුවන බවත් දන්වන ලදි.

අනතුරුව ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යාරත්න මහතා විසින් අදහස් දක්වන ලද අතර මෙම යෝජනාව නිවාස හා ප්‍රජාසංවර්ධන කමිටුවෙන් ගත් තීන්දුවක් අනුව බවත්,ඒ අනුව සමීක්ෂණයක් කළ බවත් කමිටුවට අමතරව කාර්මික නිළධාරි තුමන්ලා තුමියන්ලා විසින්ද වාර්තාවක් ගෙන ඇති බවත්,අනතුරුව පසුගිය සභාවකදි ද මේ සම්බන්ධව යෝජනාවක් ඉදිරිපත් කළ අතර එමඟින් කමිටුවක් පත් කිරීමට යෝජනා කරගත් අතර එම කමිටුවට නාගරික සංවර්ධන අධිකාරියත්,මාර්ග සංවර්ධන අධිකාරියත් ප්‍රාදේශීය සභාවත්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත් පොලිසියත් සම්බන්ධ කරගෙන මේ සාකච්ජාව කළ බවත්,ඒ සාකච්ජාවේදී සභාව එක් පාර්ශවයක් පමණක් බවත්,අනෙක් සියලු පාර්ශවකරුවන් ඉවත් කිරීම කියන තැන තැන සිටි බවත්,සභාව විසින් සානුකම්පිත පැත්ත කතා කල බවත්,ඉවත් කිරීම සඳහා ළඟ දිනයක් නොදී අවුරුදු කාල සීමාව තුළ සිදු කිරීම නොගැලපෙන

නිසා අප්‍රේල් මාසයේ මෙම දිනය යොදාගෙන තිබෙන බවත්,මෙය කමිටුවෙන් ලබා ගත් තීන්දුවක් බවත්,ප්‍රාදේශීය සභා පනත අනුව අනවසර ඉදි කිරීම් සිදු කිරීමට ඉඩ දීමට නොහැකි බවත්,අනවසර ඉදි කිරීම් පවත්වාගෙන යාමට නොහැකි බවත්,එසේ සිදු කරන්නේ නම් විගණනය වන බවත්,දක්වන ලදි.

අනතරුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී. රත්නපාල පීරිස් මහතා විසින් අනවසර ඉවත් කිරීම් වලදී කවුද කියලා හඳුනාගෙන තියෙන නිසා සත්‍ය වශයෙන්ම මේ සීමාව මොකක්ද වශයෙන් අසන ලදි.උදාහරණයක් ලෙස විධායක ඉංජිනේරු යටතේ පාලනය වන A ශ්‍රේණියේ පාරක් නම් පාරේ මධ්‍ය රේඛාවේ සිට මීටර්15ක් , B ශ්‍රේණියේ පාරක් නම් පාරේ මධ්‍ය රේඛාවේ සිට මීටර් 12 ක්, C හා D පාරක් නම් මීටර් 5 ක් ලෙස ඉදිකිරීම් සීමාවන් වන බවත්,ගංගා ඇලදොල වේනම් රක්ෂිතයක් නම් ඒ අනුව මේ ඉවත් කිරීමේදී මේ ඉදි කිරීම් සීමාව තුළ සියලුම අනවසර ඉදි කිරීම් මධ්‍ය රේඛාවේ සිට අඩි 40 ඇතුලත් මේ සියල්ලම ඉදි කිරීම් ඉවත් කරනවාද.එදිනෙදා කරන වෙළඳාම් පමණක් ඉවත් කරනවාද යන්න විමසන ලදි.එසේ කරනවානම් අනවසර සියල්ලම ඉවත් විය යුතු බවද දක්වන ලදි.එසේ නොවන්නේ නම් අපගේ විරුද්ද වීම දක්වන බව ප්‍රකාශ කරන ලදි.

මේ පිළිබඳව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. වූලංග අනුපිය අධිකාරී මහතා විසින්ද අදහස් දක්වන ලද අතර නිට්ටඹුව බස් හෝල්ඩ් එකේ එක කොටසක කොටසකට දී ඇති බවත් ප්‍රාදේශීය සභාවෙන් කුලී අය කරන බවත්,තව දෙතුන් දෙනකුගෙන් අය නොකරන බවත්,අය කරන අයට ගොඩනැගිල්ලක් හැදුවොත් ඒ කඩ දීමට හැකිවන බවත්,තවත් කොටසකට නොමැති වන බවත් සකස්කර දෙනවානම් අනෙත් කෙනාට අසාධාරණයක් වන බවත්,දන්වන ලදි.මෙය එදා සිට සිදු වූ වැරැද්දක් බවත් මෙය නිවැරදි කළ යුතු බවත්,නමුත් මේ අයට අසාධාරණයක් ද නොවිය යුතු බවත්,දක්වන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ආර්.ඒ. චන්ද්‍ර පුෂ්ප කාන්ති මහත්මිය විසින් ද අදහස් දැක්වීමක් සිදු කරන ලදි.මෙහිදී මුලදී තමා දැනුවත් වූ ආකාරයට කන්නත්තොට මාර්ගයත් ගලපිටමඩ මාර්ගයත් සම්බන්ධ වූ බව ත් මුලින්ම නිරීක්ෂණය කලේ කන්නත්තොට නිසා එහි ප්‍රතිඵලය මීට කලින් සභාවකදි මෙය හරි අමාරුයි යන කතාවකුත් ඇසුනු බවත්,මේ දෙපැත්තේ වැඩියෙන්ම කාන්තාවන් මුලිකත්වය ගත් කඩත් තිබෙන බවත්,තාවකාලිකව කඩයක් සකස් කරගෙන ටික පදිනක් යනවිට සභාවෙන් ටිකට් එකක් නිකුත් කරවාගෙන අනතුරුව තමන් ශක්තිමත් බවක් ගොඩනගා ගන්නා බවත්,මේ සියල්ලටම දේශපාලනය ඇති යන්න අදහස් නොකරන බවත්,මෙයට අපට හැකි ආකාරයෙන් විකල්පයක් යොදා ගතයුතු බවත්,ස්ථිර ගොඩනැගිල්ලක් නොවුනත් මෙහිදී කාන්තාවන් හට විශාල ගැටලුවක් ඇති බව බවත්,දක්වන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. නිමල් විජේසේකර මහතා විසින් ,මේ සම්බන්ධ පනත 1980 සිට ක්‍රියාත්මක වන බවත්,මෙය ක්‍රියාත්මක කරන්නේනම් හොඳ බවද ,අසාධාරණ වන අයට මාර්ග සංවර්ධන අධිකාරියෙන් ගිවිසුමක් මත පාර පළල් කරන අවස්ථාවකදී කඩා ඉවත් කර ගන්න කැමතිය යන ගිවිසුමක් මත බලා දෙන්න පුලුවන් බවත්,කලින් දේශපාලඥයින් විසින් අනවසර ස්ථාන ලබා දී ඇති බවත්,මින් ඉදිරියට මෙය නැවැත්විය යුතු බවත්,දක්වන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ ඉන්දික ජයලත් වේරගොඩ මහතා විසින් ,කන්නත්තොට ප්‍රදේශයේ ඉවත් කලොත් මෙය රුවන්වැල්ල ආසනයටම බලපාන බව දක්වන ලදි.ගෝනගල්දෙනිය ප්‍රදේශයේ එක් පැත්තක්ම ඉවත් වන බව දක්වන ලදි.මිනිසුන්ට ලොකු ගැටලුවක් ඇතිවන බව දක්වන ලදි.ඒ නිසා සානුකම්පිතව කටයුතු කරන්න ලෙස ප්‍රකාශ කරන ලදි.තමාගේ විරෝදතාවයද මෙලෙස සිදු කරනවානම් දක්වන බව ප්‍රකාශ කරන ලදි.මිනිසුන්ගේ ජීවිත වලට වගකීමක් ප්‍රාදේශීය සභාවටද තිබෙන බව දක්වන ලදි.

ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යාරත්න මහතා ප්‍රාදේශීය සභා පනත අනුව අනවසර ඉදි කිරීම් සම්බ්නධව පක්ෂව කතා කිරීම ද වැරදි බව පෙන්වාදෙන ලදි.මෙය පෙර සභාවකදී ද කතා කළ එකක් බව දක්වන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී. රත්නපාල පීරිස් මහතා විසින් ,මේ ඉවත් කිරීමේදී වන හානිය තුලදී යම්කිසි විසඳුමක් ලෙස කටයුතු කරනවාද මේ සිමාවන් තුළ සියල්ලගේම කටයුතු කරනවාද යන්නත් ඉවත් කිරීමේ සිමාව තුළ ඇති සියල්ල ඉවත් කරනවාද යන්න තමාට ගැටලුවක් බවත්,සුලු ව්‍යාපාරිකයින් පමණක් ඉවත්කරන්නේද යන්න විමසන ලදි.

ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යාරත්න මහතා විසින් ,නීතිය නොදැන සිටීම නිදහසට කාරණයක් නොවන බව දක්වන ලදි.අනීතිකව කර ඇති දේවල් නීතියට පිටින් කළ දේවල් බවත්,එයට නැවත අප විසින් උදව් කරන්නේ කුමකටද යන්න විමසන ලදි.මේ සම්බන්ධව තවත් තැනක් දෙනවාය කියා අපට කිව නොහැකි බවත්,මෙය තවත් තැන් තැන්වල සකස් කර ගැනීමට අනුබල දීමක් ලෙස සිදුවෙයි යන් අදහස දක්වන ලදි.ගිය සභා වාරයේදී මෙම යෝජනාවට අදාලව සුදුසු තීරණයක් ගැනීමට සම්මත වූ බවත් ඒ අනුව සුදුසු තීරණය ලබාගෙන ඇති බවත්,එම කමිටු තීරණය ක්‍රියාත්මක කිරීමට දැන් අවස්ථාව බවත්,එය සභාවට දැනුම්දීමේ යෝජනාව මෙය බවත්,දක්වන ලදි.

ඒ අනුව එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, 2025.12.11 දිනැති මහා සභා තීරණය අනුව නාගරික සංවර්ධන අධිකාරිය ,මාර්ග සංවර්ධන අධිකාරිය,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ,පොලිසිය,සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය යන ආයතනවල ඇමුණුමේ සඳහන් නිළධාරීන්ගේ සහභාගීත්වයෙන් 2026.01.23 දින රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අනවසර ඉදි කිරීම් සම්බන්ධව නිර්දේශ සහ තීරණ ගැනීම සඳහා විශේෂ කමිටුවක් පැවැත්විණි.එහිදී සියලු පාර්ෂවයන්ගේ ඒකමතික එකඟතාවය මත පහත සඳහන් තීරණ වලට එළඹිණි.ඒ අනුව කටයුතු කිරීම සුදුසු බවට , ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

- කරවනැල්ල සිට කන්නත්තොට දක්වා ප්‍රධාන මාර්ගය දෙපස අනවසර ඉදිකිරීම් සහ ව්‍යාපාර ඉවත් කර ගැනීම සඳහා 2026.04.24 දිනට පෙර ඒවා ඉවත් කර ගැනීමට ලිඛිතව දැනුම් දීම.
- එලෙස කරනු ලබන දැනුම් දීම අනුව ඉවත්කර නොගන්නා අනවසර ඉදි කිරීම් 2026.04.24 දිනෙන් පසුව පහත සඳහන් ආයතනවල ඒකාබද්ධව මෙහෙයවීමෙන් ඉවත් කිරීමට කටයුතු කිරීම.(මාර්ග සං.අධිකාරිය,ප්‍රා .ලේ.කාර්යාලය,පොලීසිය,සෞඛ්‍ය වෛද්‍ය නි.කාර්යාලය,රු.ප්‍රා.ස)
- දැනට හඳුනාගෙන ඇති අනවසර ඉදිකිරීම් /ව්‍යාපාර වලට අමතරව තවදුරටත් අලුතින් කළ අනවසර ඉදි කිරීම් තිබේනම් ඒවා ද ඉහත ක්‍රියාමාර්ග අනුව කටයුතු කිරීම.

**<u>ඊ- 17</u>**

2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුමත කර ගැනීම සඳහා වූ යෝජනාව.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ජී. සුදත් අනුර උඩුමල්වත්ත මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස,ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.ඒ.උපාලි සිරිවර්ධන මහතා විසින් භාණ්ඩ සමීක්ෂණයේ අවසන් වාර්තාව,මෙම යෝජනාව වෙනුවෙන් තීරණයක් ගැනීමට අවශ්‍ය වන බව පෙන්වා දෙන ලද අතර ගරු සභාපතිතුමා විසින් 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව,ගරු සභාව වෙත ඉදිරිපත් කරන ලදි.එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්,2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**<u>ඊ -18</u>**

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට අයත් කඩකාමර වල බදු කරුවන් විසින් එම කඩ කාමර අතුරු බදු දීමට ඉල්ලීම් කර ඇත.CLG/LG/-5/3/1-(IV වෙළුම) පළාත් පාලන දෙපාර්තමේන්තුවේ 2026.01.01 දිනැති ලිපිය මඟින් අතුරු බදු දීමේ හැකියාව ඇති බවට දැනුම් දී ඇත.ඒ අනුව අතුරු බදු දීමට මාස 03 ක කාල සීමාවක් ලබා දී ඇති බවත්,ගිවිසුම් ගත වීමේදී පෙර ගෙවුම් මුදලින් 25% ක වටිනාකමක් අතුරු බදුකරුගෙන් අය කිරීමටත්,පෙර ගෙවුම් මුදල් රහිතව දීර්ඝ කාලීන බදු ගිවිසුම් මඟින් අත්සන් කර ඇති දේපල සඳහා මාසික කුලිය මෙන් වසර 10 ක කාලයක් ගණනය කර ඉන් 25%ක මුදලක් ගණනය කර අය කළ යුතුය.ඉල්ලුම් කරඇති බදු කරුවන් සඳහා අදාල ගාස්තු අයකර ගිවිසුම් ගතව අතුරු බදු දීම සඳහා ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යොමු කිරීමට මහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එම්.බී. ස්වර්ණතිලකා මහත්මිය විසින් ස්ථිර කරන ලදි.

කඩ කාමර අතුරු බදු දීම සඳහා29 දෙනෙකු  යෝජනා වි ඇති බව, (පහත සඳහන් පරිදි )

**අතුරුබදු දීමට ඉල්ලුම් කර ඇති බදුකරුවන්ගේ ලේඛනය**

| අනු අංකය | කඩ අංකය | ස්ථානය | බදුකරුගේ නම | අතුරු බදු ඉල්ලුම් කරුගේ නම |
|---|---|---|---|---|
| 1 | 2 | රුවන්වැල්ල පොදුවෙලදපල | එස්.ගනේෂන් | ඒ .සම්මුගරාජා |
| 2 | 8 | රුවන්වැල්ල පොදුවෙලදපල | ආර්.රමේෂ් | ආර්.සුජීවා |
| 3 | 9 | රුවන්වැල්ල පොදුවෙලදපල | ඩබ්.ඒ.චේතනා නිල්මිණී වේරගොඩ | අර්චුනන් ෂන්මුගරාජා |
| 4 | 27 | රුවන්වැල්ල පොදුවෙලදපල | කේ.එච් අයි සමරවීර | බාස්කර් වික්නේෂ් |
| 5 | 29 | රුවන්වැල්ල පොදුවෙලදපල | අබුහනීෆා නූර් රිෆායා | මොහොමඩ් මුසෆ්ෆර් නස්මින් |
| 6 | 37 | රුවන්වැල්ල පොදුවෙලදපල | ඒ.පී.ජනක සම්පත් කුමාර | ඒ.ජී.එස්.ජයසිංහ |
| 7 | 46 | රුවන්වැල්ල පොදුවෙලදපල | එම්.ජේ.එම්.මිෂ්කාන් | එම්.ආර්.එම්.නව්ෂාඩ් |
| 8 | 50 | රුවන්වැල්ල පොදුවෙලදපල | ඒ.එස්.එම්.ෆාහිම් | රාමසාමි ශෂි කුමාර් |
| 9 | 65 | රුවන්වැල්ල පොදුවෙලදපල | පී.ඒ.පේමාවතී | අබ්දුල් රසීදු මහමද් නස්ලම් |
| 10 | 9 B | රුවන්වැල්ල පොදුවෙලදපල | කේ.එච්.අයි.සමරවීර | ගනේෂන් මධු මිදන් |
| 11 | 5 | භූගත කඩ කාමර | වී.සෙනවිරත්න | එස්.ඒ.අතුල සුමනදාස |
| 12 | 3 | යාවූ කඩ පහට කෙලවර | එච් පී සුසිලා වීරරත්න | කේ එන් සඳරුවන් සෝමරත්න |
| 13 | 5 | යාවූ කඩ පහට කෙලවර | වී ඒ ඩී බන්දුල අමරසිංහ | යූ කේ අජන්ත පුෂ්පකුමාර |
| 14 | 7 | යාවූ කඩ පහට කෙලවර | කෙනඩි බර්නාඩ් පෙරේරා | රාජා සම්පත් කුමාර |
| 15 | 3 | අතිරේක යාවූ කඩ පහට කෙළවර | එස් එම් සාගර කෝසල | කේ එන් සමන්සිරි |
| 16 | 5 | අගුරුවැල්ල කඩ දහය | එන් එල් චන්ද්‍රසිරි අබේතුංග | වරුණි රූපාංනී විජේවීර |
| 17 | 10 | අගුරුවැල්ල කඩ දහය | එල් ජී රන්තිකා සංජීවනී | ඒ සී කුමුදුනී |
| 18 | 1 | අගුරුවැල්ල බස්නැවතුමපොල බිම් මහල | කේ.ඒ.ඥානවතී | කේ.ඒ.ධර්මවර්ධන |
| 19 | 2 | අගුරුවැල්ල බස්නැවතුමපොල බිම් මහල | ජී.බී.ප්‍රියන්ත | ඩබ්.වී.එස්.වීරකුමාර |
| 20 | 6 | අගුරුවැල්ල බස්නැවතුමපොල බිම් මහල | ඩබ්.ලාල් ධර්මතිලක | ඥාමිනද ගිෂාන් හෙට්ටිආරච්චි |
| 21 | 1 | අගුරුවැල්ල චම්පස කඩ | එම්.වයි. ප්‍රියංකර විජේවීර | එච් ටී අමිල මධුසංක රත්නායක |
| 22 | 3 | අගුරුවැල්ල චම්පස කඩ | ඊ එම් කාන්තිලතා එදිරිසිංහ | එච් ජී එරන්දි හර්ෂනී |

| | | | | |
|---|---|---|---|---|
| 23 | 9 | අගුරුවැල්ල වම්පස කඩ | ඩබ් ජී පොඩිමහත්මයා | ඩබ් ඒ සුනිල් ශාන්ත |
| 24 | 3 | නිට්ටඹුව බස් නැවතුම්පොල | ආර් එස් කල්්යාණි | සී ඩී ලියනපටබැදි |
| 25 | 12 | නිට්ටඹුව බස් නැවතුම්පොල | ඩබ්.කේ.විමලදාස | කේ.ඩබ්.සී.එම්.කාරියවසම් |
| 26 | 16 | නිට්ටඹුව බස් නැවතුම්පොල | එම් ජී වසන්ත සදරුවන් ජයසිංහ | එස් ආර් සී පි ගුණතිලක |
| 27 | 23 | නිට්ටඹුව බස් නැවතුම්පොල | එම්.ජී.නිමල් සිරිපාල | එම්.ජී.මල්ලිකා ප්‍රේමලතා |
| 28 | 6 | රන්වැලි සංකීර්ණය | ඕ ජී ජයසිංහ | සින්නතම්බි රාසලිංගම් |
| 29 | 11 | රන්වැලි සංකීර්ණය | එස්.රාසයියා | එම්.එම්.එස්.කරුණාරත්න |

ගරු සභාපතිතුමා විසින් දක්වන ලද අතර , මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට අයත් කඩකාමර වල බදු කරුවන් විසින් එම කඩ කාමර අතුරු බදු දීමට ඉල්ලීම් කර ඇත.CLG/LG/-5/3/1-(IV වෙළුම) පළාත් පාලන දෙපාර්තමේන්තුවේ 2026.01.01 දිනැති ලිපිය මඟින් අතුරු බදු දීමේ හැකියාව ඇති බවට දැනුම් දී ඇත.ඒ අනුව අතුරු බදු දීමට මාස 03 ක කාල සීමාවක් ලබා දී ඇති බවත්,ගිවිසුම් ගත වීමේදී පෙර ගෙවුම් මුදලින් 25% ක වටිනාකමක් අතුරු බදුකරුගෙන් අය කිරීමටත්,පෙර ගෙවුම් මුදල් රහිතව දීර්ඝ කාලීන බදු ගිවිසුම් මඟින් අත්සන් කර ඇති දේපල සඳහා මාසික කුලිය මෙන් වසර 10 ක කාලයක් ගණනය කර ඉන් 25%ක මුදලක් ගණනය කර අය කළ යුතුය.ඉල්ලුම් කරඇති බදු කරුවන් සඳහා අදාල ගාස්තු අයකර ගිවිසුම් ගතව අතුරු බදු දීම සඳහා ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යොමු කිරීම සුදුසු බවට , ඒකමතිකව සහා සම්මත වු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**<u>ඊ -19</u>**

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට අයත් ලංකා බැංකුව ඉදිරිපිට ඇති කිරිහල අතුරු බදු දීමට ඉල්ලීම් කර ඇත.CLG/LG/05/03/01(ivවෙළුම)පළාත් පාලන දෙපාර්තමේන්තුවේ 2026/01/01 දිනැති ලිපිය මඟින් අතුරු බදු දීමේ හැකියාව ඇති බවට දැනුම් දී ඇත.ඒ අනුව අතුරු බදු දීමට මාස 03 ක කාලසීමාවක් ලබාදී ඇති බවත් ගිවිසුම්ගත වීමේදී පෙර ගෙවුම් වලින් 25% ක වටිනාකමක් අතුරුබදුකරුගෙන් අය කිරීමෙන් ගිවිසුම්ගතව අතුරු බදු දීම සඳහා ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යොමු කිරීමට මහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජී.වී. රුවිනි ලක්ෂ්මී ප්‍රියදර්ශිනී මහත්මිය විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් පැහැදිලි කිරීමක් ලෙස මේ යෝජනාව පිළිබඳව යම් ගැටලුවක් ඇතිවී තිබෙන බවද මේ යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීමෙන් අනතුරුව විගණන නිර්දේශයක් ද ලැබුණු බවත් ඒ අනුව කටයුතු කිරීමට සිදු වී තිබෙන බවද මෙම නිර්දේශය අනුව ගැටලු ගණනාවක් කිරිහල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඇති වී තිබෙන බවද පෙත්සමක් අනුව මෙම විගණනය සිදු කර තිබෙන බවත් 2025.03.03 වන දින විගණන දෙපාර්තමේන්තුව වෙතම යවා ඇති පෙත්සම අනුව විගණනය සිදු වී ඇති බවද මෙය අලුත් අද්දැකිමක් වන බවත් මේ සම්බන්ධයෙන් නීතිමය උපදෙස් හා පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ උපදෙස් පැතීම සඳහා මේ යෝජනාව පසුවට කල් තැබීමට සිදු වන බව දන්වා සිටින ලදි.

අනතුරුව මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව, ගරු උප සභාපති ජේ.එම්.එච්. ජයවර්ධන මහතා විසින් මේ පිළිබඳව අදහස් ඉදිරිපත් කරන ලදි.”ගරු සභාපතිතුමනි,මම හිතන්නෙ මේ දහනමය යෝජනාව සම්බන්ධයෙන් ගත්තොත් ආරම්භ වෙන්නේ 2015 මම හිතන්නේ.පශු සම්පත් අමාත්‍යවරයා විදිහට මිත්‍රපාල මැතිතුමා ඉල්ලීමක් කරනවා ප්‍රාදේශීය සභාවෙන් කෙනෙක් නම් කරලම කිරිහල පවත්වාගන්න.එතකොට අපේ පනත අනුව කෙනෙක් නම් කිරීම දේශීය කිරි ව්‍යාපෘත කරන්න ඕන නම් කිරිහලක් විවෘත කරනවා මිසක් ඉන්න තැනක් දෙන්න ටෙන්ඩර් දාල දෙන්න එහෙමනේ එන්න ඕනේ.හැබැයි මේක කෙනෙක් නම් කරලම මෙයාට දෙන්න කියලා අමාත්‍යවරයා ඉල්ලුම් කරනවා.ඊට පස්සේ ඒ ඉල්ලීමට අනුව මහ ඇමතිතුමත් ඉල්ලීම කරනවා මෙයාටම දෙන්න කියලා.එතකොට අපි මොනවා හරි බිමක් වෙන් කරලා දෙනවනම්

කිසියම් කාර්යයකට ඒක ටෙන්ඩර් පටිපාටිය කරා යන්න ඕනනේ. එහෙම නැතුව යන එකම වැරදියි.එතකොට මේකේ ඇමතිවරයාගේ ඉල්ලීම මහ ඇමතිතුමාගේ ඉල්ලීම මේ සියල්ලම ප්‍රාදේශීය සභා පනතට අනුව වැරදි හා වැරදි ක්‍රියාමාර්ග.ඊට පස්සේ සභාව සම්මත කරනවා මේක දීම සුදුසුයි එතකොට ඒ සභාවත් වැරදි.මේ පටිපාටියකින් තොරව දෙන එක අපිට ඕන ඕන කෙනාට නම් කරලා දෙනවනම් මේකේ විනිවිද භාවයක් නැහැ.මේක පටන් ගන්නෙම විනිවිදභාවයක් නැතුව.ඊට පස්සේ දැන් මේක දැන් වෙනකොට ඇවිල්ලා තියෙන තත්වය බැලුවොත් මම හිතන්නේ ඊට පස්සේ මේකෙ ගාස්තු අය කිරීම දැන් සමහර ඒවා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ තියෙනවා නිශ්චිත පටිපාටියකට ගිහින් නැති නිසා. ඒ පැවතිච්ච කාලය පුරාවටම මම හිතන්නේ නිට්ටඹු ස්ටැන්ඩ් එකේ සැහෙන කඩ තොගයක් අපි හදපුවා නෙවෙයි.එක එක්කෙනා හදාගත්තු ඒවා.ඒ ක්‍රියාවලිය තුළම අවුලක් තියෙනවා.ගාස්තු අය කිරීමේදී මම හිතන්නේ පොඩි කඩේක අය කරනවටත් වඩා අඩු ගාස්තුවක් තමයි මේකෙ අය කරන්නේ.දළ වශයෙන් එක්දාස් තුන්සියක විතර වගේ මාසික කුලියක් අනිත් කඩවලින් ඊට විශාල ප්‍රමාණයක් අය කරනවා.දිගින් දිගටම අපේ ආදායම් අංශයෙන් ඉල්ලලා තියෙනවා මේකේ තක්සේරුකරණයක් කරලා දෙන්න කියල.ඒකත් මම හිතන්නේ මේ වෙනකල්වෙලා නැහැ.එතනත් ගැටළුවක් තියෙනවා. එක්කෙනෙක් කඩේකට හත්දාහක් අටදාහක් ගෙවනවා.මේකේ 1200ගාණක් තුන්සියකට ආසන්න ගාණක් තමයි ගෙවන්නේ.එතනත් අපිට ප්‍රශ්නයක් තියෙනවා එතකොට මේක සම්මත කිරීමේදී ගැටලු ගණනාවක් ඊට පස්සේ මේක දෙන්නේ.අපේ වැඩ කරන කෙනෙකුගේ බිරිඳට.අපි සභාව විදිහට මේක සම්මත කරන කොට පැවතිච්ච දේශපාලනය අද ඒ සේවකයා අමාරුවේ දාල තියනව.එයා දැන් බරපතල ප්‍රශ්නෙකට මුහුණ දෙනවා රැකියාව පිළිබඳව.එකක්වත් අපි ඇති කරපු ප්‍රශ්න නෙවෙයි.පහුගිය කාලයේ වැරදි ක්‍රියාමාර්ගත් එක්ක ඇති වෙච්ච ප්‍රශ්න.අද විශාල පීඩනයක ඉන්නවා ඒ සේවකයා.එයාගේ රැකියාව පිළිබඳ ප්‍රශ්නයක් අපිට නීතියට පිටින් කටයුතු කරන්න බැහැ.අපි පවතින නීතියට අනුකූලව තමයි කටයුතු කරන්න වෙන්නේ.අපිට මේ යෝජනාව සම්මත කරන්න බෑ සම්මත කළොත් අපිත් වැරදියි.ඒ හින්ද මම හිතන්නේ මේ යෝජනාවෙදි අපිට කරන්න තියෙන එකම දේ අපි පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් වැඩිදුර උපදෙස් පතල ඉදිරියට ගන්න ඕන ක්‍රියාමාර්ග මොනවද කියලා බලලා තමයි මේකට ක්‍රියාමාර්ගයක් ගන්න සහා සම්මතයක් කරගන්න වෙන්නේ.මම හිතන්නෙ එතකල්ල මේක සම්මත කරන්න හැකියාවක් අපිට මේ සභාවට නෑ කියන එක තමයි මගේ හැඟීම.මම හිතන්නේ දල අදහසක් එන්න ඇති.ඉස්සරහදි මොන ක්‍රියාමාර්ගයක් ගන්නවද කියන එක නීතිමය තත්ත්වයන් සලකලා බලලා පළාත් පාලන කොමසාරිස්තුමා අපිට නිර්දේශයක් දේවි.අන්න ඒ නිර්දේශය අනුව අපි මොකක්ද කරන්නේ කියන එක සලකා බලමු.සාකච්ඡා කරමු.මම හිතන්නේ මූලික අදහසක් මම ඉදිරිපත් කළේ.ගැටළුව පිළිබඳව යම් අදහසක් ඔයාලට දැන් එලඹිලා ඇති.ඒතකොට අපිට අවුරුදු ගානක් තිස්සේ බදු ආදායමක් අහිමිවෙලා තියෙනවා.තක්සේරුකරණයන් දිගින් දිගට නැතිවෙලා 2016 මම හිතන්නේ මේක ක්‍රියාත්මක වෙන්නේ.එතකොට අවුරුදු දහයක කාලයක් අපිට බදු මුදලක් අහිමි වෙලා තියෙනවා.ඒව කොහොමද අය කරගන්නේ සංකීර්ණ ක්‍රියාවලියක් හින්දා අපි වැඩිදුර උපදෙස් අරන් ගන්න ක්‍රියාමාර්ගය කියන එකකට යමු කියන එක තමයි මම යෝජනා කරන්නේ මේක සම්මත කළ නොහැකි යෝජනාවක් විදිහට තමයි මම දකින්නේ.''

අනතුරුව මේ පිළිබඳව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. චූලංග අනුපිය අධිකාරී මහතා විසින්ද අදහස් ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදි. ''ගරු සභාපතිතුමනි,ටෙන්ඩර් වලින් තොරව තමා ගොඩක් කඩ හැදිලා තිබුනේ.නමුත් මෙතන ප්‍රශ්නේ කිරිහල කියන එක කරවනැල්ලෙත් ඇති කලා.ඉතින් මේ ප්‍රදේශයේ නියෝජ්‍ය ඇමතිතුමා මේ ප්‍රදේශයට දුන්නහම එක ඔය පුද්ගලයාගේ නෝනාගේ නමින් තමයි කරගෙන යන්නේ මම හිතන්නේ.ඉස්සරලා මම කිව්වා වාගේ කරගෙන යනු ලබන්නෙත් මේ මොරාවත්ත ප්‍රදේශයේ අතුරු බඳුකරු බොහොම අමාරුවෙන් ජීවත් වෙන කෙනෙක්.ඒ වගේම මේක ගන්න කෙනාගෙත් දරුවෙක් ඉස්කොලෙට යනවා.මම හිතන්නේ මානුෂීය පැත්ත ගැන මම කතා කරන්නේ.ඉතින් ඒක හින්දා අපිට මේකට අතුරු බදු ක්‍රමය යටතේ තමයි මම හිතතන්නේ.ඒ පුද්ගලයාට කරන්න නැති හින්දා දීල තියෙන්නේ.ඒ හින්දා මේ ගැන පොඩි අපි දැනට යොමු කරමු කියලා ගරු සභාපතිතුමා කිව්වා.ඉතින් සභාව හැටියට මම යෝජනාවක් කරනවා නිකන් මේ ගැන සානුකම්පිතව බලලා අතුරු බදු ක්‍රමයට ගිහිල්ලා මුදල පොඩ්ඩක් වැඩි කරලා හරි ලබා දෙමුයි කියන එක.''

අනතුරුව මේ සම්බන්ධව ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා විසින් අදහස් දක්වන ලදි. ''මේක බරපතල ගැටලුවක්.මේ නිර්දේශයක් ඇවිල්ලා තියෙන්නේ.නිර්දේශ අනුව වහාම ගන්න කියද්දිත් අපි මේ කරලා තියෙන්නේ දැන් මේ සම්බන්ධයෙන් උපදෙස් ගන්න.මේ පනත අපිට මතක් කරලා දීල තියෙනවා.1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 219 (1)වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාව කිසිම සභිකයකුට හෝ සේවකයකුට ප්‍රාදේශීය සභාව සමඟ ඇති කරන ලද හෝ ක්‍රියාවෙහි යොදවනු යම් ගිවිසුමක හෝ යම් වැඩයක

සම්බන්ධයක් හො මුලා සම්බන්ධතාවක් හෝ කෙලින්ම හෝ අන් ආකාරයකින් පවතින්නේ නම් සොයා බලා අදාල ගිවිසුම අවලංගු කර දේපල ප්‍රාදේශීය සභාවට පවරාගත ගතයුතුයි කියලා ඒක මතක් කරලා දෙනවා අපිට.උඩ කියනවා මේකේ මූලික සම්බන්ධතාවයක් හෝ කෙළින්ම හෝ අන් ආකාරයෙන්කින් පවතිනම් ඒ පිළිබඳව සොයා බලා අදාළ ගිවිසුම අවලංගු කර දේපළ ප්‍රාදේශීය සභාවට පවරාගත යුතුයි කියලා වගන්තියකින් පනතෙන් තියෙනවා. තක්සේරුව ලබාගෙන ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කර දේපල බදු දීම සඳහා අවශ්‍ය කටයුතු කරන්න කියලා. ඒ කියන්නේ ගිවිසුම අවලංගු කරගෙන දේපලේ නීත්‍යානුකූල අයිතිය සභාවට ගෙන රජයේ තක්සේරුව ලබාගෙන ටෙන්ඩර් ක්‍රියා පටිපාටිය අනුගමනය කරන්න දේපළ බදු දීම සඳහා අවශ්‍ය කටයුතු කරන්න කියලා මේකට පිටින් අපිට කටයුතු කිරීමේ හැකියාවක් නැහැ. අපිට දැන් එහෙම නියෝගයක් දීලා තියෙද්දි අපි ඉල්ලීමක් කරනවා පළාත් පාලන කොමසාරිස් තුමාගෙන් මේ සම්බන්ධයෙන් මොකද්ද අපිට කරන්න පුළුවන් කියලා. නීතිමය පැත්තෙන් මොකක්ද කියලා අපි තව ඒ සම්බන්ධයෙන් දැනුම තියෙන පළාත් පාලන නීතිය පිළිබඳව දැනුමක් තියෙන අය සම්බන්ධ කරගෙන ඒ ගැන වෙනම එකක් කරන්නත් අපි බලාගෙන ඉන්නවා.ඉතා ඉක්මනින් කළ යුතු දෙයක් මේක.ඒ අනුව එහෙනම් මේ සම්බන්ධයෙන් වෙන කවුරුවත් අදහස් දක්වන්න කාටවත් වුවමනාවක් තියෙනවද නෑ නේද.එතකොට මේකේ මෙහෙම කියනවා අපිට මේක ආවේ යෝජනාව ඉදිරිපත් කරාට පස්සේ.අපි මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ මේක සාකච්ඡා කළා.අපේ රත්නපාල පීරිස් මන්ත්‍රීතුමාත් හිටියා එතන.ඒ සාකච්ඡාවේදීත් වෙනම සාකච්ඡා කළා.හැබැයි ඒ සාකච්ඡා කරලා දවස් කීපයක් යනකොට තමයි විගණන නිර්දේශය ආවේ.එතකොට අපි යෝජනාව හදලා සභාවට දාන්නත් කටයුතු කරලා.කලින් බෙදන්න එපැයි ඒ වෙනකොටම තමයි මේ නිර්දේශය අපට එන්නෙත්. හරිනම් මේ යෝජනාව නෙවෙයි සභාවට දාන්න තියෙන්නේ පවරා ගැනීමේ යෝජනාව.ඒක කරන්නේ නැතුව අපි දැම්මෙ උපදෙස් පැතීම සඳහා යෝජනාව තියෙන්නෙ තක්සේරු කරන්න ඉදිරිපත් කරලා තියෙනවා. තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඒ කාර්යය වෙලා නෑ කීප වතාවක් තක්සේරු කිරීම සඳහා ඉල්ලීම් කරලා තියෙනවා.හතර පාරක් තක්සේරුව කිරීම සඳහා ඉල්ලීම් කරලා තියෙනවා.නමුත් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඒක සිද්ධ වෙලා නෑ.ඒ කාලසීමාව තුළ මේ පිළිබඳව නොදැන සිටීම කියලා කාටවත් කියන්න බෑ.මේක දැනගෙන වෙච්ච දෙයක්.අපි ඒ ගැන කතා කරන්න අවශ්‍ය නැහැ.නීතිමය උපදෙස් සහ දෙපාර්තමේන්තුවේ උපදෙස් බලාපොරොත්තුවෙන් කටයුතු කරනවා.

එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්,ඊ 19 යෝජනාව ඒ අනුව අපි ඉදිරි සභාවකට ඉදිරිපත් කිරීම සඳහා අලුත් යෝජනාවක් විදිහට ඉදිරිපත් කරමු.ඒ යෝජනාව ඒ උපදෙස් පැතීමෙන් අනතුරුව ලැබෙන උපදෙස් අනුව සහ නීතිමය උපදෙස් මතත් ඊළඟ සභා වාරයකට ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කරනවා ''ඒ අනුව ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**<u>ඊ -20</u>**

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට අයත් අඟුරුවැල්ල කඩ කාමර දහය සඳහා තක්සේරු වාර්තාව ලැබී ඇත.එම කඩ කාමර දහයෙන් 01 සිට 09 දක්වා ඇති කඩ කාමර සඳහා තක්සේරුව ක්‍රියාත්මක කරනු ලබන්නේ කුමන මාසයේ සිටද යන්නත්,එම තක්සේරුව ක්‍රියාත්මක කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කිරීමේ යෝජනාව.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජී.වී. රුවිනි ලක්ෂ්මී ප්‍රියදර්ශිනී මහත්මිය විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාවට සම්බන්ධ තක්සේරු වාර්තාව ලැබී ඇති බැවින් මෙහිදී තක්සේරුව ක්‍රියාත්මක කිරීමේ දිනය 2026.03.01 දින සිට සුදුසු වන්නේ දැයි පෙන්වා දෙමින්, මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට අයත් අඟුරුවැල්ල කඩ කාමර දහය සඳහා තක්සේරු වාර්තාව ලැබී ඇති බැවින් , එම කඩ කාමර දහයෙන් 01 සිට 09 දක්වා ඇති කඩ කාමර සඳහා තක්සේරුව ක්‍රියාත්මක කිරීම 2026.මාර්තු 01 දින සිට සුදුසු බවත්, එම තක්සේරුව ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**<u>ඊ- 21</u>**

නිට්ටඹුව බස් නැවම්පොල කඩ කාමර සඳහා වාර්ෂිකව අත්සන් කරනු ලබන බදු ගිවිසුමක් නොමැත.කඩ ලබා දීමේදී අත්සන් කරනු ලබන "රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව හා සභාවට අයත් භූමියේ කීමනී අයකරන ලද අනවසර කඩ හිමියන් සමඟ ඇතිකරගන්නා අවබෝධතා ගිවිසුම " නමින් ඇති කරගන්නා ගිවිසුමක් පමණි.මෙම කඩ කාමර සඳහා තක්සේරු වාර්තාව ලැබී ඇත.නව තක්සේරු මුදල සමඟ නව ගිවිසුමට අනුව ගිවිසුම්ගත වීමට ගරු මහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. සුසන්ත ප්‍රියන්ජිත් මහතා ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, නිට්ටඹුව බස් නැවම්පොල කඩ කාමර සඳහා වාර්ෂිකව අත්සන් කරනු ලබන බදු ගිවිසුමක් නොමැත.කඩ ලබා දීමේදී අත්සන් කරනු ලබන "රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව හා සභාවට අයත් භූමියේ කීමනී අයකරන ලද අනවසර කඩ හිමියන් සමඟ ඇතිකරගන්නා අවබෝධතා ගිවිසුම " නමින් ඇති කරගන්නා ගිවිසුමක් පමණි.මෙම කඩ කාමර සඳහා තක්සේරු වාර්තාව ලැබී ඇත.නව තක්සේරු මුදල සමඟ නව ගිවිසුමට අනුව ගිවිසුම්ගත වීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

අනතුරුව අද දිනට නියමිත කල් දී ඇති යෝජනා අවසන් වන බැවින් අද දිනට හදිසි යෝජනාවක් ඇති බැවින් එය සභා ගත කිරීම සඳහා යෝජනා කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් දන්වන ලදි.
ඒ අනුව ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ. සෙනරත් බංඩාර රාජපක්ෂ මහතා විසින් හදිසි යෝජනා ඉදිරිපත් කිරීම සුදුසු බවට යෝජනා කළ අතර එම යෝජනාව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. චූලංග අනුපිය අධිකාරී මහතා විසින් ස්ථිර කරන ලදි.
ඒ අනුව ගරු සභාපතිතුමා විසින් හදිසි යෝජනාව ඉදිරිපත් කරන ලදි.

හදිසි යෝජනා
01
**<u>ඊ22</u>**

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ රාජකාරී කටයුතු සඳහා මුද්‍රණ යන්ත්‍රයක් සැපයීමේ ප්‍රසම්පාදන කාර්යයේදී තරඟකාරී ලංසුකරුවන් හත් දෙනෙකුගෙන් ලංසු ලැබී තිබුණි.එම ලංසු තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කෙරුණි.ඔවුනගේ නිර්දේශය පරිදි පිරිවිතර වලට ගැලපෙන වඩාත් වාසිදායක සැපයීමක් සඳහා මෙට්‍රොපොලිටන් ටෙක්නොලොජීස් ප්‍රයිවෙට් ලිමිටඩ් ආයතනය නම් කර ඇත.එහි VAT රහිත මිල රු.448000.00කි.VAT සහිත මිල රු.528640.00කි.මුද්‍රණ යන්ත්‍රය සැපයීම සඳහා ඉහත පිරිවැය දැරීමට පූර්ව අනුමැතිය සඳහා ගරු මහ සභාව වෙත ඉදිරිපත් කිරීමේ යෝජනාව.

මෙම යෝජනාව ගරු උප සභාපති ජේ.එම්.එච්. ජයවර්ධන මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ රාජකාරී කටයුතු සඳහා මුද්‍රණ යන්ත්‍රයක් සැපයීමේ ප්‍රසම්පාදන කාර්යයේදී තරඟකාරී ලංසුකරුවන් හත් දෙනෙකුගෙන් ලංසු ලැබී තිබුණි.එම ලංසු තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කෙරුණි.ඔවුනගේ නිර්දේශය පරිදි පිරිවිතර වලට ගැලපෙන වඩාත් වාසිදායක සැපයීමක් සඳහා මෙට්‍රොපොලිටන් ටෙක්නොලොජීස් ප්‍රයිවෙට් ලිමිටඩ් ආයතනය නම් කර ඇත.එහි VAT රහිත මිල රු.448000.00කි.VAT සහිත මිල රු.528640.00කි.මුද්‍රණ යන්ත්‍රය සැපයීම සඳහා ඉහත පිරිවැය දැරීමට පූර්ව අනුමැතිය සඳහා ගරු මහ සභාව වෙත ඉදිරිපත් කිරීමේ යෝජනාව සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**උ. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම**

1. 2026.01.28 දින මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව(ඇමුණුම් අංක02)
2. 2026.01.20 දින කාර්මික සේවා කාරක සභා වාර්තාව(ඇමුණුම් අංක 03)
3. 2026.01.30 දින නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව(ඇමුණුම් අංක04 )
4. 2026.01.30 දින පරිසර හා පොදු පහසුකම් කාරක සභා වාර්තාව (ඇමුණුම් අංක05)

මෙම වාර්තා සභාගත කෙරෙන බව ගරු සභාපතිතුමා විසින් දක්වන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී. රත්නපාල පීරිස් මහතා විසින් කාර්මික සේවා කාරක සභා වාර්තාවෙහි ,විශ්‍රාමිකයින් ඉවත් කර එම ස්ථානයේ විදුලි අංශයේ අබලි ගබඩාව පුලුල් කිරීම ලෙස සඳහන්ව ඇති බවත්,මෙය සානුකම්පිතව අවධානය යොමු කරන ලෙස දන්වා සිටින බව ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එන්. අරුන ශාන්ත වීරසේකර මහතා විසින් ,මෙහි එලෙස අදහසක් නොවන බවත් ප්‍රාදේශීය ලේකම්තුමා සමඟත් කතා කර සුදුසු ස්ථානයක් ලබා දීම ලෙස අදහසක් ඇති වූ බව ප්‍රකාශ කරන ලදි.මෙහි අඩුපාඩුවක් ඇත්නම් වෙනසක් සිදු කරගමුයි යන්න දක්වන ලදි.

මේ පිළිබඳවම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී. රත්නපාල පීරිස් මහතා විසින් නැවතත් පැහැදිලි කරන ලදි.

ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යාරත්න මහතා විසින් යෝජනා ඉදිරිපත් කිරීමේදී ඉතා කල්පනාකාරීව කටයුතු කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ. සෙනරත් බංඩාර රාජපක්ෂ මහතා විසින් වාර්තාවෙහි නිවැරදිව අදහස පැහැදිලි වි නොමැතිකමක් මෙහිදී සිදු වී ඇති බව දක්වන ලදි.
ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යාරත්න මහතා විසින් මෙම ස්ථානය අතීතයේ සිටි ලේකම් වරියක් විසින් දී ඇති බවත් මෙය ඉතා හොඳින් අධීක්ෂණය කර ,මෙම සංගමය පවත්වාගෙන යාමටද ඉඩකඩ මදි නිසා ඔවුන්ගේ ලිපි ලේඛණ ආදිය පවා තබා ගැනීමට ඉඩ මදි කමක්ද පවතින බවද ඒ නිසා මෙය සංශෝධනය කර අනුමත කරගත යුතු බවද දක්වන ලදි.මෙය ඉතා බරපතල අවස්ථාවක් ලෙස පෙන්වා දෙන ලදි.එමෙන්න මෙම සංගමයට වැසිකිලි පහසුකම් නොමැති බවත්,එයද සකස් කළ යුතු වන බවද දක්වන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. නිමල් විජේසේකර මහතා විසින් ,වැඩි වැඩ කොටසක් ඉටු කරන විශ්‍රාමිකයින්ගේ ස්ථානයක් බව දක්වන ලදි.විශ්‍රාමිකයින්ට මෙම අවස්ථාව ලබා දිය යුතු බව දක්වන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.ඒ. සරත් සිරිවර්ධන මහතා විසින් ,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමඟ ස්ථානයක් සෙව්වද නිවැරදි ස්ථානයක් නොලැබුන බවද දක්වන ලදි.මෙහි විශාල පිරිසක් සිටින නිසා දින දෙකකදී රැස් වීමට කටයුතු කරන බවද දන්වා සිටින ලදි.

ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යාරත්න මහතා විසින් අද දිනයේද මෙහි වැඩසටහනක් සඳහාද තමා සහභාගී වූ බවත්,දැනට වසාදමා ඇති උසාවි සංකීර්ණය ප්‍රාදේශීය ලේකම්තුමා සමඟ සාකච්චා කර ලබා ගැනීමට උත්සහ කරමු යන අදහසක් දක්වන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම් . සිසිර කුමාර කස්තුරිසිංහ මහතා විසින් විශ්‍රාමිකයින්ගේමහා සභාව පැවැත්වීමටවත් මෙම ස්ථානය ප්‍රමාණවත් නොවන බවත්,මෙහිදී මෙම යෝජනාව සංශෝධනය කර ගන්නා ලෙසත් දක්වන ලදි.
ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යාරත්න මහතා විසින් මෙම සංගමයට අවශ්‍ය පහසුකම් ටික සභාව මැදිහත් වෙමින් හෝ සකසා දෙමු යන අදහස ප්‍රකාශ කරන ලදි.

ප.ව 12.10පමණ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. කමල් දේශප්‍රිය මුණසිංහ මහතා ගරු මහ සභාවෙන් පිටත්ව යන ලදි.

**ඌ.2026 ජනවාරි මාසික - ඒකාබද්ධ ලැබීම් විශ්ලේෂණය, ඒකාබද්ධ ලැබීම් සාරාංශය, ඒකාබද්ධ ගෙවීම් විශ්ලේෂණය, ඒකාබද්ධ ගෙවීම් සාරාංශය, ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තාව හා මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව,(මෙම වාර්තා මහා සභාව පැවැත්වෙන දින ලබා දීමට කටයුතු කෙරුණි) මාසික ගෙවීම් වාර්තාව හා වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම.**

**ඌ 01**

2025 දෙසැම්බර් මස අභ්‍යන්තර විගණන වාර්තාව(ඇමුණුම 07 )

**ඌ 02**

2026 ජනවාරි මස මාසික ගෙවීම් වාර්තාව**(ඇමුණුම් අංක 08)**

**ඌ 03**

**2026 ජනවාරි මාසික - ඒකාබද්ධ ලැබීම් විශ්ලේෂණය**

**ඌ 04**

**ඒකාබද්ධ ලැබීම් සාරාංශය**

**ඌ 05**

**ඒකාබද්ධ ගෙවීම් විශ්ලේෂණය**

**ඌ 06**

**ඒකාබද්ධ ගෙවීම් සාරාංශය**

**ඌ 07**

**ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තාව**

**ඌ 08**

**2026.01.31** දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

යනාදී මෙම වාර්තා සභා ගතකරන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**2026.01.31** දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

**2026.01.31 දිනට මුල්‍ය තත්වය**

| බැංකුවේ නම | ගිණුම් අංකය | මුදල |
|---|---|---|
| මහජන බැංකුව රුවන්වැල්ල | (පොදු ගිණුම) 081-1-001-3-4928744 | 22854621.82 |
| මහජන බැංකුව රුවන්වැල්ල | (සේවක ණය ගිණුම) 081-1-001-7-4928780 | 877,185.21 |
| **ස්ථාවර තැන්පත්** | | |
| ප්‍රාදේශිය සංවර්ධන බැංකුව - රුවන්වැල්ල | | 1,000,000.00 |
| මහජන බැංකුව රුවන්වැල්ල | | 40,000,000.00 |
| ප්‍රාදේශිය සංවර්ධන බැංකුව - රුවන්වැල්ල | | 10,000,000.00 |
| | **එකතුව** | **75,731,807.03** |

**එ. සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.එම්. ශ්‍රී සාන්ති කුමාරි දිසානායක මෙනවිය</u>**

ගරු සභාපතිතුමාගෙන් හා මන්ත්‍රී තුමන්ලාගෙන් හා මන්ත්‍රීතුමියන්ලාගෙන් සියලු දෙනාගෙන් ද අවසරයි.මේ රුවන්වැල්ල නගරයේ පිරිත් දේශනය පවත්වන එක හැම නගරයකම කෙරෙනවනේ.මේක ඇයි කරන්නැත්තේ? ස්පීකර් හතරෙම පිටිපස්සේ ගෙඩි හතරත් නෑ.ඒක සභාවෙන් ගලවාගෙන ආවද.හොරු ගලවගෙන ගියාද? එතකොට දැන් ඇයි ඒ පිරිත් දාන්නේ නැත්තේ? රුවන්වැල්ල නගරය කිරෙන් බාල වෙලාද?නැනේ.මම සභාපතිතුමාගෙන් අහන්නේ හැම නගරයකම පිරිත් දේශනය පවත්වනවා රුවන්වැල්ල නගරයේ විතරක් ඇයි නැත්තේ?ඇයි බෞද්ධයෝ වැඩි කොටසක් ඉන්න නගරයක් රුවන්වැල්ල නගරය.ඒ හින්ද රුවන්වැල්ල නගරයේ පිරිත් දේශනය කළයුතුම දෙයක්.ඒකට මම හිතනවා මෙතන ඉන්න මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා විරුද්ද වෙන එකක් නැතිවෙයි කියල.ඒක අපිට අඩුපාඩුවක්. රුවන්වැල්ල නගරයේ පිරිත් දේශනය පවත්වන්නේ නැතිඑක.අනිත් කතාව සභාපතිතුමනි,අපේ සභාවේ අටවැනි වාරයනෙ.සභාව තියෙන මුල්ම මහා සභාවේදීවේදී මම යෝජනා කළා.මාහල්ල ගමට බස් රථයක් ධාවනය කරන්න අවශ්‍යායි සුදුසුයි කියලා.මොකද පාසල් ළමුන් ගැන හිතලා තමා මේ යෝජනාව ගෙනාවේ.පාසල් යන වෙලාවට සහ ඇරෙන වෙලාවට පමණක්වත් අනෙක් අය ගැන හිතලා නෙමෙයි.පාසල් ළමුන් ගැන හිතලා.බස් රථයක් තාම නෑ.දැන් බස් එකක් අලුතෙන් හදලා දාන්න කල්නේ.ඒකත් නෑ.ඇයි ඒ යෝජනා ක්‍රියාත්මක වෙන්නේ නැත්තේ.ඒ යෝජනා ක්‍රියාත්මක කරන්න අපහසු ඇයි?අපි දැන් සභිකයෝ වශයෙන් මෙතැනට ඇවිත් තියෙන්නේ සියලුම දෙනාට මෙතැනට ඇවිල්ලා අදහස් ප්‍රකාශ කරන්න බැරි හින්දනේ.එන කෙනා තමා මහජන මතේ ක්‍රියාත්මක කරන්න ඕනේ.අනිත් එක දැන් පිරිත් දේශනය මගේ යෝජනාවක් නෙමෙයි.රියදුරු සංගමයේ යෝජනාවක්.පිරිත් දැම්මයි කියලා කාටවත් අපහසුතාවයට පත් වෙන්නේ නැනේ. සුළු වෙලාවයිනේ මේක දාන්නෙ.අනිත් අය ආගමික වතාවත් කෙරෙනවා නම් ඇයි බෞද්ධාගමික වතාවත් කෙරෙන්නේ නැත්තේ?අපි ඒ දේ කරන්න ඕනෙ.අනිත් එක මාහල්ලා බස් රථය පාසල් ළමුන් වෙනුවෙන් ඒ ළමයි අපහසුතාවයට පත්වෙනවා.යන්න බස් එකක් නෑ.ත්‍රීවීල් වළ ගාණ වැඩියි.අද මිනිස්සුන්ගේ ආර්ථික අපහසුතාව මත අඩුම තරමින් පාසල් ළමුන් යන වෙලාවටයි.එන වෙලාවටයි.විතරක්වත් ඒ බස් රථය දාන්න ඕනනේ.අපි සභිකයෝ වශයෙන් මෙතැනට එන්නේ මිනිස්සුන්ගේ අදහස් වලට මුල් තැන දෙන්න. ඒගොල්ලන්ගේ අදහස් ක්‍රියාත්මක කරන්නනේ. අපි තිස් දෙනාම මම හිතනවා ඒකමතිකව එකතු වෙලා හරියට වැඩ කළොත් මේ රුවන්වැල්ල නගරය සුරපුරයක් කරන්න පුළුවන්.කරන්න ඕනේ අවශ්‍යතා වැඩකටයුතු ටික කරන්නෙ නැත්තේ කියලා. ඔබතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය අපිට ගැලපෙන විෂයන් තියෙනවා.ඉස්සරවෙලාම ඔබතුමිය කියපු කාරණාව ගන්න ඕනේ. පිරිත් දේශනය සම්බන්ධයෙන්.අපි එනකොටත් තිබුණේ නැහැ.අපි ඒක ආරම්භ කරන්න කතා කරගත්තා.ඔීක මම හිතන්නෙ අක්‍රිය වෙලා දැන් අවුරුදු දෙකකට වැඩි ඇති.ඊට පස්සේ අපි යෝජනාවක් කළා.සභාවේ මෙතනත් කතා කළා.මම හිතන්නෙ. සරත් සිරිවර්ධන මන්ත්‍රීතුමත් කතා කළා.ඒ සම්බන්ධයෙන් පොඩි සංවාදයකුත් ගියා අපේ.හැබැයි අපි කවුරුවත් ඒකට විරුද්ධ එකක් තිබුනේ නැහැ.ඊට පස්සෙ අපි ඒක සකසමින් ගියා .මොකද ඔරලෝසු කණුව අලුත්වැඩියා කිරීමේ කටයුතු කරගෙන ගියානේ.අපි ඒ අතරතුර තමයි ගං වතුර ඇවිල්ල මාස තුනක් විතර වෙනවා.මෙන්න මේකත් එක්ක පොඩ්ඩක් ඒ වැඩේ යට ගියා මොකද ස්පීකරේ යන්ත්‍ර ටික ආපහු හදාගන්න ඕන ඒක අක්‍රිය වෙලා.ඒක ක්‍රියාත්මක වෙලා තියෙන්නේ මේ ප්‍රාදේශීය සභාවේ මෙතන ඉඳලා.මේ ගොල්ලන්ට ඇහෙන සීමාවේ තමයි ඒක දාලා තිබිලා තියෙන්නෙ.ඕක් කරන්න ආපහු නවත්තන්නයි ඕනෙ කවුරු හරි.පෙළක් දවස්වලට ඒක රෑ දොළහට විතර ක්‍රියාත්මක වෙනවා.ඔය හින්දා එතන ඇහෙන සීමාවේ වෙළඳ සංකීර්ණයේ ඉඳලා ක්‍රියාත්මක කරන්න ඕනේ වගේ එකක්.එතනට ඔීක සාකච්ඡා වුණා.එහෙම ඒක හදමින් ඉන්න කාලෙ තමයි ඔය ගංවතුර ආවේ.ඊට පස්සේ වැඩේ නැවතුණා.ඒක ක්‍රියාත්මක කරන්නේ නැතුව නෙමෙයි.ඒක ක්‍රියාත්මක කරනවා.ඊළඟ එක බස් එක සම්බන්ධයෙන් ඔය පාරේ විතරක් නෙමෙයි මාර්ග ගොඩක අතුරු මාර්ගවල බස් ධාවනය පිළිබඳ ගැටලු තියෙනවා.අලුත් බස් රථ නෑ.පරණ ඒවා තමයි දුවන්නේ.ඒවා අලුත්වැඩියා කරමින් දුවන ඒවා තමයි තියෙන්නේ. අපිත් මැදිහත් වීමක් වෙනවා.නිකන් හිටිය නෙමෙයි.ගලපිටමඩ නිට්ටඹුව පාරේ බස් ධාවනය සම්බන්ධයෙනුත් අපිට විශාල මැදිහත්වීමක් වෙන්න වුණා.එහෙම වෙලා තමයි ගලපිටමඩ නිට්ටඹුව පාරේ ආපහු බස් ටික දා ගත්තේ අමාරුවෙන්.ඒත් ඒක හරියට දුවන්නේ නෑ.පෙලක් වෙලාවට.එහෙම අතුරු මාර්ග ගණනාවක් නාරන්ගස්තැන්න බස් එක තිබුනෙම නෑ.ඒක ආපහු දුවනවා.එහෙම විවිධ ප්‍රශ්නත් එක්ක නැවතිලා තියෙනවා.ඒක නිදහසට කාරණයකුත් නෙවෙයි.එකක් අපේ විෂයට අදාල එකකුත් නෙවෙයි ඒක. හැබැයි අපි ඒකට මැදිහත් වෙන්නේ නෑ කියන එක නෙවෙයි.අපි ඒකට මැදිහත් වෙනවා.උපසභාපතිතුමා ගේ ගෙවල් පාර නේද? අපිට පැමිණිලි ගොඩක් එනවා.ඒ සම්බන්ධයෙන් ගැටලුවක් තියෙනවා .අපි ඒක නිවැරදි කරගන්න අවශ්‍යා කටයුතු ඉස්සරහදි කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.ඒ. උපාලි සිරිවර්ධන මහතා

ගරු සභාපතිතුමාගෙන් අවසරයි.ශිෂ්ඨ සම්පන්න සමාජයක ප්‍රජාතන්ත්‍රවාදී ආදි ග්‍රීකයන් මේක කියනවා.ඕනෑම සමාජයක මිනිසුන් කොට්ඨාශ තුනකට බෙදෙනවා කියලා.ඔවුන් පළවෙනි කොට්ඨාශය හඳුන්වනවා ඉඩියට් කියලා.සිංහල අර්ථය ගත්තොත් මෝඩයෝ කියලා කිව්වට ඒක මන්ද ආබාධිත තත්වයක් හෝ අඩු අධ්‍යාපන තත්වයක් නෙමෙයි.ඔවුන් හඳුන්වන්නේ ඉඩියට් කියලා හඳුන්වන්නේ පුද්ගලිකත්වය තකා තමුන්ගේ ප්‍රයෝජනයට තකා ඒ සියල්ලම කරන කොට්ඨාසයක්.ඒ කියන්නේ සෙල්ෆිෂ් පුද්ගලයා ඊළඟ කොට්ඨාසය හඳුන්වන ට්‍රයිට් කියල.ඒ කියන්නේ ගෝත්‍රිකයි කියලා.හැබැයි ඔවුන් ඒ ජනවාර්ගිකත්වය හෝ භූගෝලීය සම්භාවිතාවය හෝ ගෝත්‍රිකයින් කියලා හඳුන්වන්නේ නෑ.නමුත් ඒක කොට්ඨාසය කුඩා කොට්ඨාශ ගෝත්‍රික මනසකින් යුතු කොට්ඨාශ කියලා තමයි හඳුන්වන්නේ.ඔවුන් ඒකේ නිර්වචනය කරනවා.ඒ ගෝත්‍රික මානසිකත්වය කියන්නේ ඔවුන් හැමවෙලේම ඉන්නේ සැකයෙන් සහ බයෙන් කියලා.ඔවුන්ගේ මූලික සැකය සහ බය නිසා ඔවුන් සමාජයට මුදා හරින්නේ.තර්ජනය,ප්‍රචණ්ඩත්වය,සහ භීෂණය.අනෙක් කොට්ඨාසය ඔවුන් හඳුන්වනවා.අයිඩියල් පර්සන් ඇත්නම් සිටිසන් පරමාදර්ශී පුරවැසියන් සහ පුරවැසියන් කියන කොට්ඨාසය.පරමාදර්ශී පුරවැසියන් කියන්නේ සමාජය කෙරෙහි සමාජයේ අවශ්‍යතාවයන් තේරුම් ගන්න.ඔවුන්ගේ අඩුපාඩු වලදී සහයෝගය දක්වන සමාජය කෙරෙහි තමන්ගේ යුතුකම් සහ වගකීම් ඉටු කරන කොට්ඨාසයක්.ඒ නිසා අපි දැනගන්න ඕනෑ.අපි මේ කොට්ඨාශ තුනෙන් ඕකට අයත් වෙන්නද කටයුතු කරන්න ඕනේ කියලා.එතකොට කියනවා.මේ ඉඩියට්ස්ල සහ ට්‍රයිට්ස්ල කියලා ඉන්න යම්කිසි ආයතනයක් හෝ රටක් එතැනදී එකේ සාමාජික නීතියේ ආධිපත්‍ය මේ සියල්ලම කඩා වැටෙනවා.ඒ නිසා අපි තේරුම් ගන්න ඕනේ අපි මේ මොන කොට්ඨාසයකට අයත් වෙන ආකාරයෙන් කටයුතු කරනවද කියලා.ඒ එක්කම ගරු සභාපතිතුමනි,නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවෙන් මට ඉවත් වීමට ඔබතුමාගේ ගෞරවනීය අවසරය පතනවා. බොහොම ස්තුතියි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.එම්. ඉන්ද්‍රානි කුසුමලතා මහත්මිය

ගරු සභාපතිතුමනි.මම හිතන්නේ මේකේ යථාර්ථය තමයි එතුමාට තර්ජනය කිරීමක් සිද්ධ වෙලා තියෙනවා. අපි ජේ.වී.පී බව දැන ගන්න කියලා.අපේ කමිටු සභාපතිතුමාගෙන් මම හිතන්නේ ඒ වගේ තර්ජනයක් නම් ගැලපෙන්නෑ එතනට.ඒ වගේම එහෙම තර්ජනය කරන්න මූලික හේතුව උනේ අපි ඉල්ලීමක් කළා කමිටුව නියමිත දිනයක තියන්න කියලා.දැන් අපි සභාව තියෙන්නේ දෙවැනි සතියේ බ්‍රහස්පතින්දා.නිශ්චිතවම දන්නවා මේ දිනයට මේ සභාව තියෙනවා කියලා.ඒ වගේම අපි ඉල්ලීමක් කළා ඒ කමිටුව උදේ වරුවේ තියන්න කියල. මොකද දෙකටම නැතුව එකට දෙකට වගේ තිබ්බහම.ඒ මනුස්සයා කරන දෙයක් දාලා එන්න ඕනේ.එහෙම නැත්නම් අනිත් ටික කරගන්නත් බැහැ.උදේ වරුව ඉඳලා දවල් දවසේ කමිටු දෙක තුන හරි කමක් නෑ.ලෑස්ති කරගන්න කියලා.මොකද හැමෝම කමිටු දෙක තුනක ඉන්නවා.ඉතින් මේ හම්බෙන දොළොස් දාහට දහතුන්දාහට මේ ඔක්කොම කරගෙන යන්න බැහැ. අපි ජීවත් වෙන මනුස්සයෝ.එළියේ ගැවසෙනවා.අපිටත් ආදායම් මාර්ග තියෙනවා කරගෙන යන.ඒ නිසා මේක අරමුණු කරන් නෙමේ අපි මෙතනට එන්නෙ.ඒ නිසාවෙන් තමයි.අපි යෝජනාවක් කළේ.කමිටු නිශ්චිත වෙලාවක තියමු කියලා.ඒක අපි ගිය සභා වාරය ජනවාරි නෙමේ දෙසැම්බර් සභාවාරයේදී අපි කතා කර ගත්තා.ඒ නිසයි අපි දෙන්නම දැනුවත් කළේ උදේ වරුවේ තියෙනවා නම් හොඳයි කියලා එවෙලේ කැමති වුණා.ඊට පස්සේ ඉල්ලීම කරාට පස්සේ තමයි දාලා තියෙන්නේ.ගෲප් එක ඇතුලේ අපි ජේවීපී බව දැන ගන්න.ඕනවට වැඩිය දඟලන්න එපා කියලා.ඉතිං ඒ වගේ තර්ජනයක් කරනවා නම් මම හිතන්නෙ අපි කමිටුවක සහයෝගයෙන් වැඩ කරන්නබැරි පුද්ගලයොත් එකක් වැඩ කරන්නේ.ඒ වගේ ඉල්ලීමක් එනවානම් තර්ජනයක් වෙනවා නම් මේ ඉල්ලීම් සාධාරණයි.අපිට උනත් සභාවාරයකදී අපි කරන යෝජනා අපේ නමින් සටහන් වෙන්නෙ නෑ.ඒක ප්‍රශ්නෙකුත් නෑ. කැමැත්තක් ඒක. එහෙම තර්ජනය කරන්න. මම හිතන්නේ කමිටු සභාපතිට ලොකු බලයක් තියෙනවා කියලා මම දන්නෙත් නැහැ.එහෙම තර්ජනය කරනවා නම් ඒ මහත්මයාගේ තියෙන පහත් ගතියක් කියලා මම පෙන්නුම් කරනවා.

ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා

ගරු මන්ත්‍රීතුමිය.උපාලි මන්ත්‍රීතුමා මේ පිළිබඳ මට වෙනම කතා කළා.කමිටු දින පහසුවට දාගන්න එක වෙනම එකක්.පොකට් එකේ ගාණ තීරණය කරන එක වෙනයි.පොකට් එකේ ගාණත් නෙමෙයි මෙතන එන්නෙ .මේ සභාවට එන්න තමයි මන්ත්‍රීවරුන්ට ඔය දීමනාව දෙන්නේ.සභාවේ සියලු කටයුතුවලට සම්බන්ධ වෙන්න ඕනේ මේ සියලු මන්ත්‍රීලා එක්කෙනෙක් නෙමෙයි .මේක සභාවක්.ඔය කියන කතාවත් මම දන්නවා.ඒක වැරදි උපාලි

මන්ත්‍රීතුමා ඒක්ක කථා කළා.ඒ විතරක් නෙමෙයි මම එයාටත් කතා කළා.ඒ සම්බන්ධයෙන් එයාට වෙනම දැනුවත් කිරීමක් කළා.එයා වැරද්ද පිලි ගත්තා.ඒක මාත් එක්ක කිව්වා සමාවෙන්න කිව්වා.මං වෙනුවෙන් උපාලි මන්ත්‍රීතුමාට මං එයා වෙනුවෙන් සමාවෙන්න කියන එක කිව්වා.ගරු උපාලි මන්ත්‍රීතුමාට මේ සිද්ධිය සම්බන්ධයෙන් යම් හිත් රිදවීමක් වුනානම් සමාවෙන්න කියලා.මොකද උපාලි මන්ත්‍රීතුමාට මම ගරු කරනවා. එතුමා යම් අදහසක් එක්ක වැඩ කරන කෙනෙක්.යම් දර්ශනයක් තියෙන කෙනෙක්.ඒ අනුව වැඩ කරන කෙනෙක්.ඒ හින්දා ඒ ගරුත්වය තියෙනවා.එතුමා මොකක් හරි කිව්වොත් මම ඒ දේවල් කරලා දෙන්නත් ඉක්මනට මැදිහත්වෙනවා.යම් අවබෝධයක් එක්ක මේ සභාවේ කටයුතු කරන කෙනෙක්. පළවෙනි සභාවකට තමයි ඇවිල්ලා ඉන්නෙ.සභාවේ කටයුතු කෙරෙන්නේ කොහොමද කියලා හොඳ අධ්‍යනයක් තියෙන කෙනෙක්. ඒ පිළිබඳව අගය කිරීමක් කරනවා.ඔය දින වකවානු සම්බන්ධයෙන් වෙනම තීන්දුවක් ගන්න ඕනෙ.අපිට පහසු විදිහට ගන්න අපි හදාගමු.හවස දාන එක .ඒක කමිටුවල සාකච්ඡා කරලා කමිටුව දිනයේදීම සාකච්ජා කර ගන්න.අපි මේ ටික මේ පිළිවෙළට හදාගමු කියල මේ දිනයට මේක යන්නෙ නැතුව එක දවසක දාගන්න පුළුවන් නම් කමක් නෑ. විෂය නිලධාරීන්ටත් ලේසියි.පහසු විදිහට අපි දාගමු.හැමදාම එන්න ගියොත් මෙතැනට වගේ ඒවා කියන්න එපා.ගැලපෙන්නෙ නෑ.එතකොට සාක්කුවේ තියෙන ගානට මෙතැනට එනවා කියන එක නෙමෙයි. අපේ කවුරුවත් පඩි ගන්නේ නෑ. වැටුප ගන්නේ නැතුව වැඩ කරන්නෙ.පෞද්ගලිකව ගන්නේ නෑ . ඒක අරමුදලට දෙනව.එතන වෙනම කැපකිරීමක් ඒක.එහෙම කිව්වොත් එන්නම බැනේ.ඒගොල්ලන්ට මම කීයක් වත් ගන්නෙ නෑ. එන්නෙම නෑ කිව්වොත් බැනේ.සාකච්ඡා කරලා සුහදව මේ වැඩේ කරමු.ඔයාලා ඔක්කොම බෙදලා දාලා තියෙන්නෙ.මේතන කමිටුවට නැති කෙනෙක් කවුරුත් නැනෙ.හැමෝම කමිටුවට ප්‍රජාතන්ත්‍රවාදීව මම ඒ කටයුත්ත කළා.හැමෝම බෙදලා ඒ වුවමනා විදිහට පස්සේ අපේ ගරු මන්ත්‍රීතුමන්ලා පස්සේ ඒත් අපි ගානට බෙදලා හැම එකටම එන විදිහට දාලා තියෙනවා.ඒ ඇරෙන්න මම හිතන්නේ නෑ අසාධාරණයක් වෙයි කියලා.උපාලි මන්ත්‍රීතුමා මුකුත් හිතන්න එපා.ඒක ඉවරයි.ආපහු කතා බහ කරලා ඉමු සභාවේත් තියෙන දේවල් ගැටුම් බවට පත්කර ගන්න ඕනේ නැහැ.අපි ඒ කටයුත්ත කරමු.මං එක්කත් තරහ වෙන අය ඉන්නවා.මේ ඔක්කොමලා එක එකපාරට මමත් කියල දානවනෙ. එහෙමත් වෙනවා.එහෙම ප්‍රශ්නයක් නෑ එහෙනම්.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ආර්.ඒ. චන්ද්‍ර පුෂ්ප කාන්ති මහත්මිය**</u>

ගරු සභාපතිතුමනි.ගලපිටමඩ නිවාස අහිමි වෙච්ච අය ගංවතුර වෙලාවෙ. ඒ අයගේ තාම දැන්නම් ඔප්පු එහෙම ගේන්න කියලා තියෙනවා.ලක්ෂ 50 දෙන්නනේ.නමුත් ඒ ගොල්ලන්ට අර කුලිය තාම හම්බ වෙලා නෑ කුලියක් දෙනවනේ. ඒ තුන්දෙනාම ඉන්නේ කුලියට.ඒ කුලිය විසිපන්දාහ ද කොහෙද මාසෙකට ගෙවන එක තාම මොකුත් නෑ .සුසන්ත කියන එක්කෙනාගේ කඩේටත්.එයා එදා කිව්වා නම් තිබුනෙ නෑ කියල.ඊයේ පෙරේදා ආවද කියල නම් මම දන්නේ නැහැ.සීයක්ද කොහෙද නම් ලැයිස්තුවක් එනවා කිව්වනේ.

<u>**ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා**</u>

එක සැරේම නෙමෙයි මන්ත්‍රීතුමිය.සැරින් සැරේ ආවා.පළවෙනි වටේ ඉන්න ඇති කුඩා කර්මාන්ත කියන එකනෙ.ලක්ෂ දෙක ගානේ අපි පළවෙනි එක ගෙව්වා.වසන් තිස් හයකට ඊට පස්සේ එකේ ආපහු ඇවිල්ලා තියෙනවා ඒක දෙන්න පුළුවන්.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ආර්.ඒ. චන්ද්‍ර පුෂ්ප කාන්ති මහත්මිය**</u>

කුලිය පොඩ්ඩක් අරන් දෙන්න පුළුවන් වුනොත් හොඳයි. මොකද එතන මහත්තයා නැති එක්කෙනෙක් ඉන්නවා.

<u>**ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා**</u>

ඒක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා වෙන දෙයක්.ඒක මතක් කළා.එකකට විතරක් නෙවෙයි.හදිසියේ හින්දා මුදල් ඇවිත් නෑ.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ආර්.ඒ. චන්ද්‍ර පුෂ්ප කාන්ති මහත්මිය**</u>

මහත්තයා නැති කෙනෙකුත් ඉන්නවා. ළමයි ඉන්නවා.ඒ නිසා ටිකක් පොඩ්ඩක් ඉක්මන් කරලා දෙන්න.

**<u>ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා</u>**

ඒක මම දන්නවා.ආපහු කතා කරමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.ඒ. සරත් සිරිවර්ධන මහතා</u>**

ගරු සභාපතිතුමනි, ඉඹුලාන ආයුර්වේදයේ තත්වය දැන් කොහොමද.පටන් ගන්න දැන් කටයුතු තියෙනවද? කඩිගමුව එකට තමයි ගොඩක් කට්ටිය දැන් යන්නේ.ඉතින් ඒකට මොකක්ද තියෙන පිළියම කියලා තමයි දැනගන්න කැමතියි.ඒ වගේම මම මගේ පෞද්ගලික යෝජනාවක් හැටියට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ කොමසාරිස් චමින්ද කුලරත්න රුවන්වැල්ල පාසල් මධ්‍ය මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙක්.එතකොට මට මතකයි අපේ නොනත් වැඩකරන කාලෙ හෙඩ් ප්‍රිෆෙක්ට්.වෙලා හිටිය.ඊට පස්සෙ නීති විද්‍යාලයට ඇතුළත් වුණා.මා දන්නවා ඇමෙරිකා එක්සත් ජනපදයේ ආචාර්ය උපාධිය කළා.ඒ වගේ හොඳ දක්ෂ නිලධාරියෙක්. නමුත් මම දන්නෙ නෑ.ඒකෙ පෞද්ගලික පැත්ත මොකක්ද කියලා.රුවන්වැල්ල රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලයෙන් ඉගෙන ගත්ත උඩ පුටුවලට ගිය කට්ටියගෙන් එක්කෙනෙක් හැටියට මම එතුමා දකිනවා.නමුත් පහුගිය දේශපාලන අධිකාරිය ගත්ත වැරදි තීරණ නිසා රුවන්වැල්ල රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලයේ අධ්‍යාපන තත්වය පහලට ගියා.ඒකට කහටගස්තැන්නෙ ඉස්කෝලෙට තමයි බලපෑවේ.හුඟක් කට්ටිය අපි දන්න කාලේ ඉඳන්ම කිතුල්ගල දැරණියගල හැමතැනින්ම ඉස්කෝලවල කට්ටිය මෙතැනට ආවේ ඉගෙන ගත්තා.හොඳ පුටුවලට ගියා.නමුත් ඒක සම්පූර්ණම දැන් නැතිවෙලා ගියා.දැනට රුවන්වැල්ල ප්‍රදේශයේ ශිෂ්‍යත්වයෙන් පාස් වෙන කට්ටියටත් රුවන්වැල්ලේ එන්න අමාරුයි.නමුත් යහපාලන ආණ්ඩුව කාලේ ආදි ශිෂ්‍ය සංගමයත් එක්ක මම ගිහිල්ල අකිල විරාජ් ඇමැතිතුමාට කියලා අපි අවුරුදු දෙකක් නැවැත්තුවා.ඒක ළමයි ගන්න.එක ඒ ආණ්ඩුව ආවට පස්සේ නැවතත් ඒක පටන් ගත්තා.ඉතින් ඒක දේශපාලන අධිකාරිය ගත්ත වැරදි තීරණයක්.ඉතිං මම කනගාටුවෙනවා.චමින්ද කුලරත්න වගේ ජ්‍යේෂ්ඨ නිලධාරිතුමාට මේ වෙච්ච අකරතැබ්බය ගැන මගේ බලවත් අප්‍රසාදය.පළකරනවා හරි හෝ වැරැද්ද මම දන්නේ නෑ. නමුත් මම මගේ ආදි ශිෂ්‍යයෙක් හැටියට මේ ප්‍රාදේශීය සභාවේ කණගාටුව ප්‍රකාශ කරනවා. බොහොම ස්තූතියි.

**<u>ගරු උප සභාපති ජේ.එම්.එච්. ජයවර්ධන මහතා</u>**

ගරු සභාපතිතුමනි,මන්ත්‍රී තුමන්ලාගෙන් හා තුමියන්ලාගෙන් අවසරයි.මම හිතන්නේ එකක් ඔය චමින්ද කුලරත්න මහත්මයාගේ ප්‍රශ්නය.අපි ආණ්ඩුවක් විදිහට ඒක සම්බන්ධයක් නෙවෙයි.ආදි ශිෂ්‍යයෙක් තමයි රාජසිංහයේ.හැබැයි වංචා දූෂණවලට සම්බන්ධ නම් ඒක කොයි ඉස්කෝලෙ ආදි ශිෂ්‍යයෙක් ද කියන එක අදාළ වෙන්නෙ නෑ.එතකොට ඒවා අපේ රජයක් විදිහට නෙවෙයි.අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වංචා දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව ඒවා විසින් කරන පරීක්ෂණවල ප්‍රතිඵල මත තමයි ඒ ප්‍රශ්නය එයාට ගොඩනැගෙන්නේ.නැතුව මේක හිතාමතා කරන වැඩක් නෙවෙයි.මම හිතන්නේ ඉදිරියේදී බොහෝ වැරදි කරලා තියෙනවා නම් කාටත් ඒ වෙනුවෙන් පරීක්ෂණ එන්න ඕනෙ.ඒ වැරදි වලට දඬුවම් ලැබෙන්න ඕනෙ.ඒ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක්.ඒ නිසා එයා කොයි ඉස්කෝලෙද කියන එක අදාළත්වයක් නෑ .මම හිතන්නෙ ඒක අර රටේ වංචා දූෂණ විමර්ශනවලට එහෙම යන ක්‍රියාවලියේ ප්‍රතිඵලයක්.ඒක අපේ ප්‍රදේශයේ එක්කෙනෙක් වෙච්ච එක්ක විතරයි.මේකේ තියෙන වෙනස.ඒ සම්බන්ධයෙන් ඒක තමයි ස්ථාවරය.ඊට පස්සේ පුෂ්ප කාන්ති මහත්මිය විසිපන්දාහේ දීමනාව.ඒකෙ නම් තියෙන්නේ වසර අවසානයේ මුදල් ගිණුම් ශූන්‍ය කරනවා.ඊට පස්සේ වසරේ මුල මාර්තු අග ජනවාරි අග වෙනකොට තමයි ගිණුම්ගත වෙන්නේ පටන් ගන්නෙ.මම හිතන්නේ තව සතියක් දෙකක් යනකොට මුදල් එනවා.එතකොට ඒ ගෙවීම් කටයුතු සිද්ධ වෙනවා.ඊගාවට වැන්දල ප්‍රාථමිකය සම්බන්ධ ප්‍රශ්නය ගත්තොත් වැන්දල ප්‍රාථමිකය ඒකට අනුබද්ධ කරනවා නෙවෙයි.කරනවා. ඒක දේශපාලනය විසින් හදපු ඉස්කෝලයක්.ඒක විසින් මේ ප්‍රදේශයේ ශිෂ්‍යත්වය සමත් දරුවන්ගේ අයිතිවාසිකම් විශාල ප්‍රමාණයක් උල්ලංඝනය වෙනවා.හැබැයි අපි දිගින් දිගටම ගිය අවුරුද්දේ මේ ප්‍රශ්නය ආවා ශිෂ්‍යත්ව සමත් 143,144ළමයි දාගන්න බැරි වුණා.අපි විශාල පරිශ්‍රමයක් දරලා තමයි ඒ ළමයි ටික දාගත්තේ.පන්තියකට ළමයි ප්‍රමාණය වැඩි කරලා එතකොට මේ අවුරුද්දෙත් ඒ ප්‍රශ්නෙ එහෙමම ආවා.මේ ප්‍රශ්න එන්නේ මෙහෙම.එතකොට තිබ්බ ආණ්ඩුව

2022 නඩුවක් යනවා.වැන්දල ප්‍රයිමරියේ පැත්තෙන්.මූලික අයිතිවාසිකම් නඩුව.අධිකරණය ඊට පස්සේ නඩුව ඉල්ලා අස්කර ගන්නවා.එකඟතාවයකට එනවා.ඒ වසරේ ළමයි ටික ගන්නත් වැන්දල ප්‍රාථමිකය රාජසිංහ මේ පාසල් දෙක ඒකාබද්ධ කරලා එතකොට ඊගාව අවුරුද්දෙ ඉඳලා ඒකාබද්ධ වෙන්න ඕනෙ.හැබැයි මේක තිබ්බ්ච දේශපාලනය.වැන්දල ප්‍රයිමරිය ඒකාබද්ධ වුනොත් එතකොට සෙන්ට්‍රල් එකෙන් තමයි 1 වසරට බඳවා ගන්න.එතකොට අර දේශපාලනය කරන්න බැහැ.අමාත්‍යාංශය පාලනය කරන්නෙත් එයාලා.ඊට පස්සේ මොකද කරේ ඒක එකාබද්ධ කළෙත් නැහැ.හැබැයි අධිකරණය එකඟවෙලා තිබුණා කවුරුහරි අධිකරණයේ ප්‍රශ්න කළොත් තමයි මේකේ ප්‍රශ්නයක් එන්නෙ.කවුරුවත් ප්‍රශ්න කළේ නැහැ. ඒ විදිහටයි.ඇවිල්ලා ආණ්ඩුව වෙනස් වෙනවා.ඊට පස්සෙ.අපිටත් සිද්ධ වෙනවා මේ සම්බන්ධයෙන් මොකක්ද ගන්න ක්‍රියාමාර්ගය රජයක් විදිහට.විරුද්ධයි මේ ඒකාබද්ධ කිරීමට.පක්ෂයක් විදිහට විරුද්ධයි.ශිෂ්‍යත්වය සමත් ළමයින්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වෙනවා හැබැයි අධිකරණය එකඟ වෙච්ච එකක්.මේ ඉන්න අමාත්‍යාංශ ලේකම්ට හෝ ඇමතිට හෝ වෙනස් කරන්න බෑ. අධිකරණයට අපහාස කළා කියලා නඩුව දානවා.කවුරු හරි මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය කරනවා.ඒ හින්දා මොකද කළේ අපි ඕ.පී එකත් එක්ක කතා කරලා මේ අවුරුද්දේ නඩුවක් දාලා තියෙනවා.මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම පිළිබඳව අධිකරණයකින් ගත්ත තීන්දුවක් අධිකරණය හරහාම තමයි ආපස්සට හරවන්න පුළුවන්.කට්ටිය දිගින් දිගටම අපෙන් ඉල්ලීම් කළා. මේක වෙන් කරන්න කියලා වෙන් කරන්න ගිහිල්ල බලපුවම තමයි නීතිමය තත්වය සලකලා බැලුවම මේ අමාත්‍යාංශ ලේකම් නෙවෙයි එකඟ වෙලා තියෙන්නේ.හැබැයි අමාත්‍යාංශ ලේකම් එකඟ වෙලා තියෙනවා.එතකොට මෙයාද කවුද කියන එක අදාළ නැහැ.ඒ හින්දා.මේක විසඳන්න නම් අධිකරණය හරහාම තමයි විසඳන්න වෙන්නේ.ඒ සඳහා ක්‍රියාමාර්ග අරන් තියෙනවා.රාජසිංහයේ ආදි ශිෂ්‍ය සංගමය මූලික අයිතිවාසිකම් නඩුවක් මේ වෙනකොට ඉදිරිපත් කරලා තියෙනවා. එතකොට අමාත්‍යාංශය පැත්තෙන් අපිට පුළුවන් රජයක් විදිහට මේ ක්‍රියාවලිය වැරදි අමාත්‍යාංශයත් එක්ක දිගින් දිගටම කතා කළා.අමාත්‍යාංශය එකඟයි. ඒකාබද්ධ කරපු ක්‍රියාවලිය නීත්‍යානුකූල නෑ කියලා කියන්න.ඒක ටිකක් දිගට පැහැදිලි කරන්න ඕනෙ පාසල් දෙකක් ඒකාබද්ධ කරන කොට දිගු ක්‍රියාවලියක් තියෙනවා.ඒ ක්‍රියාවලිය සියල්ල සම්පූර්ණ කරලා නැහැ.තව මාර්තු මාසේ නඩුව විමසන නඩු තීන්දුවෙන් මේක දෙකක් බවට පත් වෙනවා.මොකද මේ පටලලා තියෙන පැටලිල්ල ලෙහන්නට හදිසියේ බැහැ.ඊගාවට ශිෂ්‍යත්වය.සරත් මන්ත්‍රීතුමා කිව්ව විදිහට එකසිය හතළිස් පහ කට්ඕෆ් මාර්ක් එක සෙන්ට්‍රල් එකේ ශාෂත්ව සමත් ලකුණු 140. ලකුණු 5 ක ළමයි ඉන්නවා.ඊට පස්සේ ඒකට විසඳුමක් විදිහට.අපි ඒ අය එකතු වෙලා.අධිකරණයේ නඩුවක් ෆයිල් කරලා තියෙනව.ඒ ක්‍රියාවලිය මේ වෙනකොට යනව. අපි මේක පැහැදිලිව වෙන් කරනවා. ඔන්න ඕක තමයි මේකේ තත්ත්වය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.ඒ. සරත් සිරිවර්ධන මහතා</u>

උප සභාපතිතුමා ඔබතුමා හරි.ආදි ශිෂ්‍ය සංගමයේ ලක්ෂ පහක් වියදම් කළා.නඩුව වෙනුවෙන් අනිත් පැත්තෙන් ඇල්ලුවේ ජනාධිපති නීතිඥයකේ අනිත් පැත්තෙන් ඇල්ලුවෙත් එහෙම එක්කෙනෙක් නමුත්.එකඟතාවය ආවා කියන එක මම ඔබතුමාගෙන් තමයි දැන්ගත්තේ.එකඟතාවය ආවා කියන එක.නෙමෙයි මම කියන්නේ.ඔබතුමා කිව්වේ මානව හිමිකම් දාලා තියෙනවා කියලා.ඒක හරි.නමුත් අධ්‍යාපන ලේකම්තුමා ලියුමක් ගහලා තියෙනවා.1 වසරේ ඉඳන් 13 වසර වෙනකන් මේක ඒකාබද්ධ කළා.ආයතන විසි එකකට ඒක දැනුම් දීලා තියෙනවා.ඒක මම ගාව තියෙනවා.මම අද ගෙනාවේ නැහැ.ආයතන විසි එකකට මේවා කරනවා. ඒක දැන් ක්‍රියාත්මකයි.මම ඒකයි දැන් කිව්වෙ අර අධිකරණ තීන්දුව ආවට පස්සේ ආයෙ වෙනස් වෙන්න පුළුවන්.දැන් ක්‍රියාත්මක වෙනවා.

<u>ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා</u>

මේක වෙනම කථා කළ යුතු දෙයක්.නීතිමය ක්‍රියා මාර්ග ගනිමින් තියෙන්නේ.දැනුම් දීමක් කරන්න තියෙනවා අපනයන කෘෂිකර්ම නිළධාරීතුමිය ඇවිල්ලා ඉන්නවා.ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා දැනුවත් කරන්න.විනාඩි 10 ඕනේ කියලා ඒ හින්දා අපි කෙටියෙන් අපේ අදහස් දැක්වීම් කර ගම්මු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්. මොහොමඩ් රසියා සකාෆ් මහතා</u>

ගරු සභාපතිතුමනි,රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයිති තොටුපොළවල් සම්බන්ධවයි.ගඟට බහින්න තියෙන තොටුපොළවල් සම්බන්ධවයි ඔය තොටුපොළවල් ටික දැන් කොච්චර තියෙනවද? නිශ්චිතව තාම දැනුවත් නෑ.ගොඩක් තොටුපලවල් වලට පාරක් තියෙනවානේ.මහපාරේ ඉඳලා තොටුපලට යන්න පාරක් තියෙනවා.ඒ මාර්ග පවා අහිමි වෙමින් පවතිනවා.අපිට ඒ තොටුපලවල් ටික හදන්න වැඩක්.අද නෙවෙයි පහුගිය දවස් වල මං සභාපතිතුමාට හදිස්සියෙන්ම කතා කළා.ගොඩනැගිල්ලක් ඉදිකරනවා.පාරක් වහලා හදිසියේ ග්‍රාමසේවකතුමිය ගෝනාරඹින් මට කතා කරලා කිව්වා.මෙහෙම වැඩක් යනවා මන්ත්‍රීතුමා පොඩ්ඩක් ගිහිල්ල බලන්න කියලා බලපුහාම තොටුපළට යන්න පාරක් වහල තමයි වැඩේ කෙරෙන්නේ.ඒ නිසා සභාව මැදිහත් වෙලා තොටුපොළවල් ටික ආපහු ප්‍රතිසංස්කරණය කළොත් හොඳයි කියලා මම යෝජනා කරනවා.ඔක්කොම කැලෑ වැහිලා ගිහිල්ල තියෙන්නෙ.මොකද දැන් ඕවා අපිට පවරගන්න තිබ්බව ඉඩමකුත් අහිමි වෙලා තියෙනවා අපිට.ඒ මිනිස්සු අනවසර අය ඉන්නෙ.කොහොම හරි ඔප්පුවකුත් හදල.කොහොම හැදුවද කියලා මම හරියටම දන්නෙ නෑ.ගොඩක් දවසක ඉඳලා මම සභාවේ ඔය යෝජනාව ඉදිරිපත් කළා.සේවා පියස වගේ එකක් හදමු කියලා.ඒක දීර්ඝ වැඩක්.තොටුපොළවල් සම්බන්ධව අවධානය යොමු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා

ඒ ඉඩම සම්බන්ධයෙන් අපි ප්‍රාදේශීය ලේකම්තුමත් එක්කත් සාකච්ඡා කරලා කටයුතු කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී. ප්‍රභාෂිනි රුක්ෂි මහත්මිය

இருமான்புரம் தோத்துக்கு டிசம்பர் முப்பத்தி ஒன்னு, ஜனவரி எட்டு, ஜனவரி ஏழு, ஜனவரி ஒன்பது. மொத்தமா நான்கு முறைகள் வந்து கழிவு நீர் கழிவுகளை கொண்டு வந்து ஓடையில கொட்டப்பட்டு இருக்குது ஐயா. அது வந்து யாரு வந்து கொட்டுனா அந்த மாதிரி அது இல்ல. அந்த தோட்டத்து அங்க இருக்கும் பகுதி மக்களுக்கு வந்து அது வந்து பெரும் ஒரு இன்னலா இருக்கு. ஏன்னா இந்தக் கோடை காலத்துல வந்து வெயில் அதிகம். அதனால ஊத்து தண்ணி அத எடுத்துதான் மக்கள் வந்து குடிநீருக்கு பயன்படுத்துறாங்க. அது மட்டுமில்லாம அவங்க நாளாந்த செயல்பாடுகளுக்கும் அந்தத் தண்ணி தான் பயன்படுத்தப்படுது. அஸ்மத்தையும் அந்த மாதிரி தான். அதே மாதிரி கண்ணன் தொட்டில கொலனி அந்த பிரதேசமும் அந்த மாதிரி தான். தண்ணிக்கு பெரும் பிரச்சனையா இருக்குது. மழைக்காலத்துல ஊற்று நீர் இருந்தாலும் அது கோடை காலத்துல வத்தி போகுது. அதனால மக்கள் அந்த ஆத்துக்கு போயிட்டு அந்தத் தண்ணி எடுக்குற மாதிரியான ஒரு நிலைமை தான் இப்ப வரைக்கும் இருக்குது. அதுக்கான ஒரு ஒரு பவுசர் மூலமா கொண்டு வந்து தண்ணி குடுத்தா ரொம்ப நல்லது மக்களுக்கு அப்படிங்கிறது என்னோட கருத்து. ரொம்ப நன்றி.

අනතුරුව මේ අදහස පිළිබඳව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි එම්.එස්. මොහොමඩ් රසියා සකාෆ් මහතා විසින් පැහැදිලි කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි එම්.එස්. මොහොමඩ් රසියා සකාෆ් මහතා

ගරු සභාපතිතුමනි.මන්ත්‍රීතුමිය ප්‍රකාශ කරන්නේ අසූචි ජලය පහ කරපු වත්තක් ගැන.දෙසැම්බර් 31 ජනවාරි 1, 2.ජනවාරි 7 ඒවගේ දිනවල අසූචි දැම්මා කියලා.ඒක බොහොම අපිරිසිදු භාවයට පත් වුණා කියල.හත්මත්තේ වත්තේ.උග්‍ර ජල හිඟයක් පවතිනවා කියල. ඒකටත් විසඳුමක් දෙන්න කියලා.කන්නත්තොට කොලනිය ජනපදයට ගියපාර නියඟයේ දී ගොඩක් ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වුණා.අපට සභාපතිතුමා මැදිහත් වුණා.මුකුත් කරගන්න බැරුව ගියා මොකද අපිට ජලය දෙන්න තරම් ප්‍රතිපාදන නෑ කියලා සභාව සතුව.උප දිසාපතිතුමා ළඟට ගිහිල්ලත් කතා කරපුවහම එය ආපදා එකට දුන්නා ඒ ප්‍රශ්නෙ. දැන් ආයේ එනවා පොඩ්ඩ පොඩ්ඩ නියඟය. දැන්ම මේ සම්බන්ධව මොකක් හරි වැඩක් හදමු කියන එක තමයි එතුමිය කියන්නේ.

ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා

අසූචි මිශ්‍ර බවුසර් ගෙනල්ලා දැම්මා කියන කාරණය.අපි ඒ කාරනාව ගැන දැනුවත්.අපි.ඒ වෙලාවෙම පොලිසියටත් දැනුම් දුන්නා .මොකද අපි ගිහිල්ලත් බැලුවා.පොලිසිය දැනුවත් කළා.ඒ ප්‍රදේශවාසීන් කොහොමහරි රකිනවා කියලා

තිබුණ හොයන්න නමුත් කොච්චර රක්කත් පොලිසිය බැලුවත් මේ වැඩේ වෙලා තියෙනවා.දෙතුන් සැරයක්ම හතර වතාවක් ම කොහොම හරි.අසූචි මිශ්‍ර ජලය දැම්මා කියලා තමයි කියන්නෙ.පීඑච්අයි මහත්තයා ගියා.එම් ඕ එච් එකේ ඩොක්ටත් ගියා. හැබැයි කෙනෙක් අපිට හොයා ගන්න බැරි උනා.දැන් මෑතක ආපහු දැන් නැහැ.ඒ පිළිබඳ වෙනම පොලිසිය නිතර ගියා.මේක හොයන්න.හම්බ උනේ නෑ කවුරුවත්.ඒක අසූචිමද කියලා කියන්නත් බෑ.පීඑච්අයි මහත්තයා එහෙම කියපු විදිහට එහෙම හරියට කියන්නත් බෑ.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. ධම්මික සනත් රත්නසේකර මහතා**</u>

ගරු සභාපතිතුමනි,කර්මාන්ත ශාලාවේ ඇමෝනියා එකක්.පොල් කැලි වලට එහෙම දානවා ඒක.

<u>**ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා**</u>

ඇමෝනියා මිශ්‍ර එකක් කියලා තමයි කියන්නේ.ඒක ගඳයි නේ.එතකොට ඒක තමයි වෙලා තියෙන්නෙ. ජල හිඟය සම්බන්ධයෙන් දැනටත් ඉල්ලීම් එනවා.ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරමින් යනවා.කොහොමද වතුර ටික දෙන්න පුළුවන් කියන එක.දැනට යෝජනා වෙලා තියෙන විදිහට ජලය ප්‍රතිපාදන පිළිබඳ ප්‍රශ්නයක් නෙවෙයි තියෙන්නේ. වතුර බෙදන්න පුළුවන් ඕන තරම් බෙදනවා කියන එක නෙවෙයි.බෙදාගන්න පුළුවන්කම තියෙනවා.නමුත් බෙදන ක්‍රමවේදයක් තමයි ඕනේ.ඒ අවසරය ලබා ගැනීම තමයි තියෙන්නෙ ගැටලුව දැනට අපි යෝජනා කරගෙන තියෙන්නේ.ජලය අවශ්‍ය ප්‍රදේශවල ජනතාවගෙන් අත්සන් ලේඛනයක් ගන්නවා. ජලය මේ ගොල්ලො මෙච්චර ගත්තා කියලා අත්සන් ලේඛනයක් ගන්නවා.වතුර දීලා අස්සනක් ගන්නවා.එහෙම තමයි ඉදිරිපත් කරන්න කියලා තියෙන්නේ.ඒ ලේඛනය අනුව තමයි ජලය බෙදන්න වෙන්නෙ.මම හිතන්නේ ප්‍රමාණයක් තියෙනවා.ඒකේ ඒ ප්‍රමාණය පොඩ්ඩක් ඉස්සරහදි හොයාගන්න පුළුවන් වෙයි .ඒක හොයලා බලලා ඉස්සරහදී ජලය ලබා දීමේ කටයුත්ත කරන්න බලාපොරොත්තු වෙනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම් . සිසිර කුමාර කස්තුරිසිංහ මහතා**</u>

සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.බස් රථ ධාවනය පිළිබඳ ප්‍රශ්නයක් ආවා . ඒක අපිටත් බලපාලා තියෙනවා. මොරලිය ගමට බස් රථයක් කියන එක තාම නෑ. මෑත භාගයේදී උතුරු ගෝනගල තිබුණේ එක බස් එකයි. ඒකත් නැතුව ගියා.තව ටික දවසකින් තව බස් එකක් නැතුව යනවා වගේ ජේනවා හේතුව. කියන්න ඕනේ පසුගිය රජයන් වගකියන්න ඕනේ ඒවත් තියෙනවා.හේතුව ගම් වල තියෙන බස් රථවල දුවන්නේ ඒ ගමේම ඉන්න ඩ්‍රයිවර්ලා.පිටින් ඇවිල්ලා බස්වල දුවන්න කැමති නෑ.මේ ගම්වල බඳවා ගත්ත රියදුරු මහත්වරු පැන්ෂන් යනකොට දාන්න කෙනෙක් නෑ.පිට අය එන්න කැමති නෑ.ලාබේ අඩුයි දුවන්නේ නෑ.මිනිස්සුන්ගේ අවශ්‍යතාවය අනුව. අපේ විෂයට අයිති නැති වුණත් අපි එකතුවෙලා මේක දැනුවත් කරලා කොහොම හරි බස් රථ ටික නැවත යොදවන්න අපි උත්සාහ කරමු.අපි එකතුවෙලා කරන්න ඕනේ කියන කතාවේ ඉන්නවා.එකක් ඇමැතිවරයෙක් ආවහම ඒ ප්‍රදේශයෙන් ඩ්‍රයිවර්ලා ටික බඳව ගත්තාම අර අවශ්‍ය ප්‍රදේශවලට නෑ.ඒ වගේ ප්‍රශ්න තමා දැන් ඇවිල්ල තියෙන්නෙ.නමුත් එහෙම වෙලා මේ මිනිස්සුන්ට තියෙන අවශ්‍යතාව නැති වෙන්න දෙන්න බෑ.අපි ඔක්කොම එකතු වෙලා නැතිවෙන්න යන බස් ටික නැති වෙච්ච ටික ගන්න උත්සාහයක් ගම්මු කියලා ඉල්ලා සිටිනවා. සභාපතිතුමාගෙන් ඒ වෙනුවෙන් අපි උපරිම සහය ලබාදෙනවා.ඒ වගේම තමයි අර සෙන්ට්‍රල් එකේ ප්‍රශ්නය ඇත්ත.මේ පළාතටම ශිෂ්‍යත්වයෙන් පාස් වෙලා එන දරුවන්ට යන්න තිබුණු තැන ඕකට.ඒ අවස්ථාවේ අපි ඕකට ගොඩක් විරුද්ධව සැහෙන්න කටයුතුකලා සභාපතිතුමා දන්නවා ඇති. මටත් කනගාටුවක් ආවා.ඕකට විරුද්ධව අපිත් එක්ක මෙතන උද්ඝෝෂණය කරපු දැනට ඉන්න අධ්‍යාපනයේ කට්ටිය ඉන්නැද්දී.ඇයි ලියුමක් ගහලා මේ දෙක ඒකාබද්ධ කළේ කියලා මම පස්සේ හොයලා බලපුවාම නැවත ඒකට නඩුවක් දාලා තියෙනවා කියලා කිව්වා. අනිවාර්යයෙන් ඒක නොවිය යුතු දෙයක්.ඒ දෙක ඒකාබද්ධ කළ යුතු නැහැ.වැන්දල ප්‍රයිමරිය තනිකර දේශපාලනයට කරපු දෙයක්.ඒ අවස්ථාවේ අපි විරුද්ධව හිටියා.මම ගොඩක් ඕකෙන් බැට කෑවා.පොළ ළඟදී එක්තරා දේකට සම්බන්ධ වෙච්ච.හිටපු සභාපතිවරයෙක් සහ මන්ත්‍රීවරයෙක් මාත් එක්ක ගහ ගන්න තැනට ආවා.අපි ඒකට විරුද්ධව හිටියා.මම හිතුවා මේ අවස්ථාව වෙනකොට ඕක සමථයකට පත්කර ගන්න පුළුවන් වෙයි කියලා.ගන්න පුළුවන් උපරිම ක්‍රියාමාර්ග අරගෙන ඒ ඒකාබද්ධ වීම වැළැක්විය යුතුයි.මේ ප්‍රදේශයේ දරුවන් වෙනුවෙන් ඊළඟ කාරණාව.කාර්මික කමිටුවට අදාළයි.අපිට අලුතෙන් විදුලි පහන් දෙන්න බැරි උනත් තියෙන ඒවායේ නැවත බල්බ් ටික සවි කර ගන්නට අපි කතා කරගෙන යනව ටිකක් මන්දගාමී වගේ පොඩි උත්සාහයක් ගන්න අපිට ගම්වල ප්‍රශ්න එන නිසයි කියන්නෙ.තියෙන ටික අලුත්වැඩියා කරලා ඒ ටිකවත් ඉක්මන් කරගන්න බලමු. මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

<u>**ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා**</u>

වීදි ලාම්පු සම්බන්ධයෙන් කමිටුව තීරණයක් අරන් තියෙනවා.ඒ අනුව කටයුතු කරනවා.මම හිතන්නේ කොට්ඨාස වෙන් කරගෙන තියෙන්නෙ.මොරලියට මම හිතන්නෙ.අද දා ගන්න හැදුව හරිගියේ නෑ .අනිද්දට පුළුවන් එහෙම දාගන්නවා.එහෙම ගැටලුවක් නැහැ.බෙදාගෙන තියෙනවා.ඒ අනුව වැඩ කරමින් යනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ ඉන්දික ජයලත් වේරගොඩ මහතා</u>

ගරු සභාපතිතුමනි,බස් ප්‍රශ්නය ගැන කතා කරපු හින්දා. සංවර්ධන කමිටුව මෙතන ඉන්න අයට නියෝජනය කරන්න බැහැ.ඔබතුමා එතැන නියෝජනය වෙනවා. එතකොට ඒ සංවර්ධන කමිටුව තුළිනුත් ඔබතුමාලගේ ආණ්ඩුව ඔබතුමාට දෙයක් කරන්න පුළුවන් කෙනෙක් වශයෙන් රුවන්වැල්ලට වගකියන නායකයා වශයෙන් ඇත්තටම ඔබතුමා දන්නවා.ඔබතුමාගේ ගමට යන ගෝනගල්දෙණිය ඉඳලා ගලපිටමඩ බස් රථය මම හිතන්නේ මතක ඇති කාලෙක ඉඳලා බස් රථය නෑ.මට මතකයි යන්න බැරි පාරක් තිබුණේ කාපට් කරලා අංග සම්පූර්ණ කරලා ඉවර වෙනකොට එදා තිබුණු ආණ්ඩුව ගියා.මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව ගියා.බස් රථය දාන්න බැරි උනා.මම ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමනි මේ ආණ්ඩුව යටතේදී පුලුවන්නම් මේ බස් රථය ලබා දෙන්න.කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා ඒ වගේම ගරු සභාපතිතුමනි මේ නාය ගිය අපේ පැත්තේ ප්‍රදේශයේ ගෙවල් ඉවත් කරලා තියෙනවා.හැබැයි ඒ අය වෙන නිවාස හොයාගෙන ගිහිල්ලා තියෙනවා. කුලියට විසිපන්දාහ ගරු සභාපතිතුමනි ලැබිලා නැහැ.මේ කට්ටියට දෙන දෙයක් ගැන තාම කතාවක් නෑ.අඩුම ගානේ විසිපන්දාහ වත් ඒ අයට ලබාදෙන්න කටයුතු කලොත් තමා හොඳ නැත්නම් ඒක කට්ටිය කබලෙන් ලිපට වැටුණා වගේ තාම කොයි වෙලෙත් අපට කතා කරලා කියනවා. මහකන්ද බස්නාගොඩ නායගිය අය ඉවත්කරන රිපෝට් ඇවිල්ලා ඉවරයි. නිවසෙන් යන්න කියල.නමුත් ඒ කට්ටියට රුපියල් විසිපන්දාහ තියා රුපියලක්වත් මේ වෙනකොට ලැබිලා නැහැ.ඒ ගැනත් බලන්න කියල ඉල්ලා සිටිනවා.ඒ වගේම ගරු සභාපතිතුමනි රාජසිංහ විද්‍යාලය අපේ ලංකාවට නම ගෙනිච්ච චමින්ද ජයරත්න මහත්මා මීට කාලෙකට ඉහතදී එතුමා ට්‍රාන්සර් එකක් ලැබුණා.ලංකාවේ එහා කෙලවලට අපට.ඒක රුවන්වැල්ලට කරපු ලොකු අසාධාරණයක්. එතුමා නිසා තමා වොලිබෝල් ක්‍රීඩාව මේ රුවන්වැල්ල රාජසිංහ විද්‍යාලයේ බැබලෙන්නේ ජාතික ක්‍රීඩාව.මම හිතන්නේ පහුගිය ආණ්ඩු වලිනුත් එතුමාට ට්‍රාන්සර් ආපු සියල්ල නවත්ත ගත්තා .හැබැයි මේ ආණ්ඩුවේ දී ඒක කරගන්න බැරිව ගියා දෙමව්පියන්ට.හැබැයි එතුමා නිවාඩු දාලා ඇවිල්ලා රුවන්වැල්ල රාජසිංහ විද්‍යාලය බබළවනවා.පළවන ස්ථානයත් දෙවන ස්ථානයත් දෙකම රුවන්වැල්ලට ගේනවා.ඒක අපිට ලොකුට සතුටක්.පක්ෂ පාට භේදයකින් තොරව සතුටු වෙන්න ඕනෙ.ඒ නිසා එතුමාට නීත්‍යානුකූලව ඒ අවසරය ලබා දෙන්න.එතුමාගේ රැකියාවක් ලබාගන්න පුළුවන් නං ගරු සභාපතිතුමනි ඒකත් හොඳයි.ඒ වගේම අවසාන කාරණය.පෞද්ගලිකව මා ගැන.සභාවේදීත් කිව්වා මේක දිගටම මට වෙනවා හැබැයි මම දන්නෙ නෑ.ගරු සභාපතිතුමනි,ඔබතුමත් ගමෙන් ආපු කෙනෙක් අපි වගේ.මේක නිතර නීතිය අපි පස්සෙ යන්න ඕන.ඒක හරි.නමුත් ගරු සභාපතිතුමනි මේක ඇයි මෙහෙම වෙන්නෙ අපි ඔබතුමාලාගේ පක්ෂයටවත් එක්සත් ජාතික පක්ෂයටවත් මම කිසිම මොහොතක උඹ කියලවත් කතා කරලා නෑ.ඒක තමයි මගේ දේශපාලනයමට කවුරුහරි කියනවා නම් නැගිටලා.අපි ආණ්ඩු කරන කාලේ අපි ලේකම්වරු වෙලා හිටියා.කවදාවත් අපි කාටවත් පහර දීලා නැහැ.හැබැයි මට අරගලයේ ආවා.ඒකයි මම කතා කරන්නේ.අපි එහෙම කරලා නෑ.විවෘතව කියන්න ඕනෙ.සම්පත් මන්ත්‍රීතුමා නෑ .හැබැයි මට එහෙම අරගලය මගේ ව්‍යාපාරික ස්ථානයට මම ව්‍යාපාරික ස්ථානයේ වහලා දානවා.මට ඒකට මුහුණ දෙන්න බැරි වෙනවා.මම දෙවැනි වතාවේදී දරුවත් එක්ක යන ගමන් මම කියන්න හිටපු කතාවක් නෙවෙයි .දරුවත් එක්ක යනකොට පාසල ඇරිලා මගේ වාහනයට පහර දෙනවා .නීතිය ඉන්නේ වෙන පැත්තක නීතියෙන් පිළිසරණ ඉල්ලනවා. මට නීතියේ පිළිසරණ ලැබෙන්නේ නැහැ.අද නඩුවක් යනවා.අරගලේ කාලේ එතකොට ඔබතුමාලගේ ආණ්ඩුව නෙවෙයි.හැබැයි නීතියෙන් කියනවා මේක සමථ මණ්ඩලයට ලබාදෙන්න කියල සමථ මණ්ඩලයට යොමු කරනවා .අරගලේ කියන එකේදී ආණ්ඩු පක්ෂයක් නැතිව වැඩ කළා.

<u>ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා</u>

ගරු මන්ත්‍රීතුමා ඔබතුමන්ලා විසින් පත් කරගත්ත ආණ්ඩුව ජනාධිපතිවරයෙක් තමා හිටියේ එතකොට.වන්දි කොච්චර ගත්තද ලක්ෂ කොටි ගනන් වන්දි අරගත්ත.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ ඉන්දික ජයලත් වේරගොඩ මහතා</u>

අපි අරගෙන නෑ.මට වෙච්ච අසාධාරණයට මම රුපියලක්වත් අරගෙන නෑ.මම කතාකරන්නේ මම ගැන ගරු සභාපතිතුමනි.ඊට පස්සේ මම සමථ මණ්ඩලයට යනවා යනකොට සමථ මණ්ඩලයේ මේක ගන්න වත් විදිහක් නෑ කියලා නැවත උසාවියට නඩුව යනවා.හැබැයි නඩුව තියෙන අයම ඔබතුමාලගේ ආණ්ඩුව යටතේ.සම්පත් මන්ත්‍රීතුමාගේ නමවත් යොදන්නේ නෑ.ඒ මගේ ගමේ කෙනෙක් වශයෙන් මම එතුමාට ඒක සැලකුව.ඡන්දය

දිනලා.මම හැබැයි හයසීයක් ඡන්ද ගන්නවා.ගමෙන් හයසීයක් ප්‍රදේශයෙන් හයසීයක් ගන්නවා.මට මිනිස්සු කැමති නැත්නම් ගරු සභාපතිතුමනි හයසීයක් ඡන්දෙ දෙන්නෙ නෑ.පක්ෂයක් නෑ.නායකයෙක් නෑ.හැබැයි ඉන්දික වේරගොඩ කියන පුද්ගලයාට නායකයෙක් මගේ වේදිකාවේ කවදාවත් නැගලා නැහැ.ඒ 600 ගත්ත මිනිහට මගේ ගේ ගාවදි සම්පත් මන්ත්‍රීතුමා ළඟ ඉන්නැද්දී මගේ ගෙදරට ගහනවා සම්පත් මන්ත්‍රීතුමාගේ නම දාන්නේ එතුමා.අලුත් මන්ත්‍රීවරයෙක් වශයෙන්.හානියක් වෙන හින්දා මම නම් දාන්නේ නෑ.හැබැයි ඊට පස්සේ නීතිය තුන් වතාවක් ක්‍රියාත්මක වෙනවා.ගරු සභාපතිතුමනි.මේ සති දෙකක් ඉස්සරලත් මම යනවා.ගලපිටමඩ පොලිසියෙන් ලියුම ගෙනත් දෙනවා.පහුවදා මට යන්න තියෙන්නේ සියලු දේ අරගෙන පහුවදාම යනවා.මට සතියක් කල් ගන්න පුළුවන් කියල.නීතිඥවරු කිව්වා මම පහුවදාම ගියා.මගේ හදවත මම දන්නවා.මම කරන රැකියාව මම දන්නවා.මම හම්බ කරන විදිහ මම දන්නවා.ඒ නිසා ඒ ඔක්කොම අරගෙන.මම මේ ඔබතුමාට මේක දැන්ගන්න කියන්නේ.නැත්නම් කවුරුහරි මේක කියල නැවත නැවතත් මේ මිනිස්සු අතර වෛරය ඔබතුමා නෙවෙයි.දැන් සති දෙකක ඉස්සරලත් මාව කැඳෙව්වා. තුන්වෙනි වතාවට මාව කැඳවන්නේ ගරු සභාපතිතුමනි.ඔවුන් කියනවා.වාහන විසි පහක් විතර ලැයිස්තුවක් දෙනවා මට. මගේ කියලා.හැබැයි මම භාරගන්නේ නෑ.අනුන්ගේ වාහන වලට මගේ නම දාලා.මේ කියන කට්ටියත් අපි දන්නවා සභාවේ ඉන්නවා.කට්ටිය ඒකයි මම කියන්නේ.දැන් ඔබතුමා වෙන කවුරු හරි මං ගැන බලන්න පුළුවන්.අපි නිකම් වාහනේක යනකොට.මේ හොරා කාපු සල්ලි කිව්වම තව කෙනෙක් ඒක පිළිගන්නවා. ගරු සභාපතිතුමනි මේක නිවැරදි වෙන්න ඕන.ඒකයි මම කියන්නේ.දැන් ඒ පරීක්ෂණය අවසන්.එයාලා බාර ගත්තා.මම ආදායම් බදු ගෙවන වාර්තා දුන්නා.සල්ලි හොයන විදිහ දුන්නා.මේ තුන්වෙනි වතාවටත් එතුමාලා කිව්වා මේක ලොකු වැරැද්දක්.මගේ තියෙන වාහන විස්තර නිවැරදිව දුන්නා.

ප.ව 12.50 පමණ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ. මධුෂ සචිත් කුමාර මහතා ගරු මහ සභාවෙන් පිටත්ව යන ලදි.

<u>ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා</u>

දේශපාලනයේදී අපි කවුරුවත් වෛරය වපුරවන්නේ නැහැ.මෙතන සිදුවීම වෙලාවේ රුවන්වැල්ල බේර ගත්තේ මම කියලා මට ස්තූතියි කළා.රුවන්වැල්ලේ කාටවත් මොකක්වත් වෙන්නේ දුන්නේ නැහැ කියලා.ස්තූති කළා මේ මොකක්වත් වෙන්න නැතුව බේරගන්න උදව් කළා කියලා.නීතිමය පැත්තෙන් වෙන දේවල්වලට අපි ඇඟිලි ගහන්න යන්නේ නෑ.පරණ ඒවා මොකක්ද වුණේ? නීතියට ඇඟිලි ගැහුවා. දැන් ඒවා එකක්වත් වෙන්නෙ නෑ. බය වෙන්න එපා.සාදාරනව වැඩේ යනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. සුසන්ත ප්‍රියන්ජිත් මහතා</u>

කතන්දරේ මෙහෙමනෙ.කලින් වැඩ කරපු අය එක්ක මන්ත්‍රීතුමා භේදයක් ඇති වුණා.ඒගොල්ලෝ සහයෝගයෙන් වැඩ කළා.අපිත් එක්ක කාලයක්.ක්‍රියාකාරී ව ආවෙ නෑනෙ.ඊට පස්සේ ඡන්දෙකදී පස්සේ කව්දෝ මන්දා මෙයාලගේ ගෙදරට ගල් ගහලා තිබුණා.ඊට පස්සේ.තාම නඩු යනවා.මෙයා ගිහිල්ලා උසාවියේ තියෙනවා නඩු තුනක් මන්ත්‍රීතුමා මම හිතන්නේ මන්ත්‍රීතුමා.එතකොට අර සමාජයක් පාලනය කරගන්න බැරුව තමන්ගේ හිටපු සෙට් එක පාලනය කරගන්න බැරුව මෙතන ඇවිල්ල මේ ප්‍රාදේශීය සභාව මොනවා කරන්නද?විශාල කාලයක් අරගෙන.මොකක්ද කියන්නේ කියලා අවබෝධයකුත් නැහැ.මේක උසාවි යන නඩුවක්. හැබැයි.

<u>ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා</u>

මේවා ලේඛනගත වෙනවා.නමක් ගමක් කියනවා නම් කල්පනාවෙන් කියන්න මේක නීතිමය ලියවිල්ලක්. ඔබතුමාලා සභාව නියෝජනය කළා.මෙච්චර කාලයක් ඒ සම්බන්ධව අවබෝධයක් තියෙනවද කියලා මම දන්නේ නෑ.ලේඛන ගත වෙනවා.මේ ඒකට තමා රෙකෝඩින් වෙන්නෙ.ඒ හින්දා මේවා නඩු භාණ්ඩ මතක තියාගන්න කියන හැම වචනයක්ම.වගකීමක් සහිතව කතා කරන්න ඉගෙන ගන්න නැත්නම් ගැටලුවක්.මම කියන්නෙ.පුද්ගල නාමයන් භාවිතාකිරීම කියන්නේ බරපතළ ගැටලුවක්.පාර්ලිමේන්තුව නෙවෙයි. පාර්ලිමේන්තුවේ වරප්‍රසාද තියෙනවා ඕන දෙයක් කියන්න.මේ කියන කාරණා බරපතළ නඩු කියන්න පුළුවන්.වාර්තා ලේඛණ ගත වෙනවා.අනවශ්‍ය දේවල් මේකට ගේන්න එපා කියන්නෙත් මේකයි.සභා පනතට

අනුව ගැලපෙන දේවල් විතරක් මේ සභාව තුළ සාකච්ඡා කරන්න ඕනේ කියන කාරණය මතක තියාගන්න වෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. චූලංග අනුපිය අධිකාරී මහතා</u>

සභාපතිතුමනි.දිට්වා සුළි කුණාටුව හේතුවෙන් විනාශයට පත් වෙච්ච කුඩා තේ වතු හිමියන් ගැන මං ටිකක් කතා කරන්නේ සෑහෙන ප්‍රමාණයක් ඉන්නවා.තමන්ගේ මාස හතේ අටේ පැළ තිබ්ච්ච අය.ඒවා නරක් වෙලා ගියා. ලොකු ගස් දවස් ගණනක් තිබ්ච්ච ඒවා.සවුත්තු වුණා.කුඩා තේ වතු හිමියන්ට,කුඩා තේවතු සංවර්ධන අධිකාරියෙන් දුන්නා ග්‍රාම නිලධාරී අත්සන් කරලා.ෆෝම් එකක් ගෙනහිල්ලා ප්‍රාදේශීය කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට බාර දෙන්න.නමුත් ඒ ටික බාර දුන්නත් තවම නම් ඒ ගැන ඇවිල්ලා බලන්නවත් ආවේ නැහැ.වැඩි ප්‍රමාණයක් භාර දීලා තියෙනවා.ඒ වගේම නාය ගිය නැතත් ඔබතුමත් ගියා අපේ පහලදන්නොරුව එහෙම.නාය ගිහිල්ලා නෑ ගෙවල් හතරක් තියෙනවා.එච්. එම්. සමන්ත හේරත් මහත්තයා.ඩී. ජී. උපුල් කුමාර,.ඩී. ජී. සෝමපාල, ආර්.ජයසිංහ. කියන හතර දෙනා.දැනට ඒ අය අයින් වෙලා ඉන්නේ.නමුත් ඒ අයටත් මම හිතන්නෙ රුපියල් විසිපන්දාහක් දීමනාවත් හම්බවෙලා නෑ.ඒ වගේම ඒ අයට තව අවශ්‍ය වාසස්ථානයක් කටයුතු වෙලත් නැහැ එක පාරටම කරන්න අමාරුයි.නමුත් ඒ ලැබිය යුතු රුපියල් විසිපන්දාහ කුලියට ඉන්න තැනක්වත් අඩු ගානේ ලබා දෙන්න පුළුවන් නම් හොඳයි සභාපතිතුමනි.මේක අපේ උප සභාපතිතුමා කිව්වා.1991 ඉඳලා මේ දක්වා අපේ ප්‍රාදේශීය සභාවේ දැනට නැති ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු පොඩ්ඩක් ඒ ගැනත් ලේඛනයක් ගත කළොත් හොඳයි.ඒ වගේම ගරු සභාපතිතුමනි.නාය ගිය තැන්වල පෙළක් අය පදිංචි වෙලා.නාය ගියේ නැතත් පුපුරලා තියෙනවා.තමන්ගේ ඉඩකඩම් දාලා යන්නෙ නැතුවද මන්දා.ඒ තැන්වලට යනවා .ඒ අය ගැනත් මම හිතන්නේ විශේෂ අවධානයක් යොමු කරන්න.විශේෂයෙන් වැද්දැවල ප්‍රදේශයේ එහෙම වෙලා තියෙනවා.මම හිතන්නේ ඒ පැත්තට ආපහු ගිහිල්ලා පාර පුපුරලා තියෙනවා.ඒ තැන්වලටම ගිහිල්ලා.නැවත පදිංචි වෙලා තියෙනවා.ඒ අය ගැනත් විශේෂ අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා.ඒ වගේම සභාපතිතුමනි ඉස්සර ප්‍රාදේශීය සභාවේ ගංසභා තියෙන කාලේ පාර දෙපැත්ත සුද්ද කරන්න යනවා. දැන් නම් ඒක කාලෙකින් සිද්ධවෙලා නෑ.ඒ පාර දෙපැත්ත පොඩ්ඩක් මාර්ග සංවර්ධන අධිකාරිය නම් ගිහිල්ලා සුද්දා කරනවා.ප්‍රාදේශීය සභාවෙනුත් ඉස්සර යනවා. ඒකත් මතක් කරන ගමන් ඔබතුමා අපට දුන්නා විදුලි බල්බ් ටිකක් එහෙම ලබා දුන්නා.නමුත් දැනට දෙකක් පිච්චිලා තියෙනවා.ඒකත් ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.එහෙනම් බොහොම ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.කේ. නීල් නෙල්ෂන් කඩදර මහතා</u>

ගරු සභාපතිතුමනි,ගැටමුරුත ආදාහනාගාරයේ දකුණු පැත්තේ ලොකු කානුවක් කපලා තියෙනවා.අඩි පහක හයක ලොකු ගැඹුරු කානුවක්.ඒ කාණුව එහා පැත්තෙන් කපලා තියෙන්නෙ.එහා පැත්තේ ඉඩමේ කපලා තියෙන්නේ.නමුත් ගස් කොළන් කොහාට කැරකෙයිද දන්නෙ නෑනෙ.වැටුනොත් ආදාහනාගාරයට අපිට ලොකු වියදමක් දරන්න වෙනවා.ඒ ගැන තමයි දැනුම් දෙන්නේ.

<u>ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා</u>

බලමු අපි ඒ ගැන.එහාපැත්තෙ මුල් කැඩිලා වගේ ද? ඒක සොයා බැලීමක් කරන්නම්.අද දවසේ සභාවාරය සඳහා පැමිණිල තමන්ගේ අදහස් ඉදිරිපත් කරලා කටයුතුවලට සහාය දීම සම්බන්ධයෙන් සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා.
ඒ අනුව ප.ව 01 .00 පමණ ගරු මහ සභාවේ කටයුතු අවසන් විය.